# 2023 ජනවාරි මස 05 වන දින පෙරවරු 9.30 ට
# මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද
# මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී. එම්. සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. එම්. මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. ඩබ්. එම්. නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ. ඩී. අනුර ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. ලලිත් ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. කේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්. බී. නිලංක සිල්වා මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. කේ. පී. සුසන්ත පෙරේරා මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. කුමාර රාජරත්න මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. පිලිප් පැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. බී. මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. උපිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩි. ඩබ්. ඩි. රන්දු නිරෝෂණ මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. දීපා චාන්දනි ආරියවංශ මහත්මිය |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රි ගුණසේකර මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජෙරාඩ් ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්. එම්. ඒ. දෝන දිලාශිනි මහත්මිය |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී. එම්. නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |

42. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය
43. මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
44. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. පී. ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය
45. මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
46. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්. කේ. ඩි. තාරක මුණසිංහ මහතා විසින් 2023.01.05 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. <u>වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.</u>

### 01(01) 2022.11.01 දින පැවති විශේෂ මහා සභා වාර්තාව.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ජී. එම්. සුරංග නිශාන්ත අපෝන්සු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 2022.11.01 දින පැවති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව පිලිගතයුතු යැයි යෝජනා කර සිටිනවා.

එම යෝජනාව මහා නගර සභා මන්ත්‍රී, එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.

2022.11.01 දින මහ සභා රැස්විම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

### 01(02) 2022.11.25 දින පැවති විශේෂ මහා සභා වාර්තාව.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ජී. එම්. සුරංග නිශාන්ත අපෝන්සු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 2022.11.25 දින පැවති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු යැයි යෝජනා කර සිටිනවා.

එම යෝජනාව මහා නගර සභා මන්ත්‍රී, එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.

2022.11.25 දින මහ සභා රැස්විම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

### 01(03) 2022.12.01 දින පැවති මහා සභා වාර්තාව.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ජී. එම්. සුරංග නිශාන්ත අපෝන්සු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 2022.12.01 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු යැයි යෝජනා කර සිටිනවා.

එම යෝජනාව මහා නගර සභා මන්ත්‍රී, එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදී.

2022.12.01 දින මහ සභා රැස්විම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 02 <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන</u>

**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

02(01) ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මැතිතුමා අද දිනයේ සභාවට සහභාගිවීමට නොහැකි බව දන්වා තියෙනවා.

02(02) ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, තරංග නෙල්සන්, ගයනි නෙල්සන් විසින් ඉදිරිපත් කල ලිපිය සභාව හමුවේ තබනවා.

තරංග නෙල්සන්/ ගයනි නෙල්සන්
අංක 17,
නිහාල් නෙල්සන් මාවත,
රාවතාවත්ත,
මොරටුව
2023.01.04

ගරු නගරාධිපතිතුමනි,
සමන්ලාල් ප්‍රනාන්දු මැතිතුමා,
මහා නගර සභාව,
මොරටුව.

නැසිගිය ගායක නිහාල් නෙල්සන් කලාකරුවානන්ගේ අවමංගලාය කටයුතු වෙනුවෙන් දුන් පූර්ණ දායකත්වයට ස්තුතිය පලකිරීම සම්බන්ධවයි

නැසීගිය ප්‍රවීන ගායක නිහාල් නෙල්සන් කලාකරුවානන් වන අපගේ පියාණන්ගේ අවමංගල්‍යය කටයුතු වෙනුවෙන්, විශාල මෙහෙවරක් කල මොරටුව මහා නගර සභාවේ ගරු නගරාධිපතිතුමා සමන්ලාල් ප්‍රනාන්දු මැතිතුමාට, නියෝජ්‍ය නගරාධිපති සමන්ත ද සිල්වා මැතිතුමාට, අප ප්‍රදේශය නියෝජනය කරමින් ඒ වෙනුවෙන් වෙහෙස වූ කේසර රවින්ද්‍ර මන්ත්‍රීතුමාට, විපක්ෂ නායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන්ට හා මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස්තුමාට හා සේවක මඩුල්ලට අපගේ ස්තූතිය මුලින්ම පිරිනමන්නෙමු.

අප පියාණන් ජීවතුන් අතර සිටියදී අප පදිංචි මාර්ගය "නිහාල් නෙල්සන් මාවත" නමින් නම් කිරීමට විශාල කැපකිරීමක් කරමින් ඒ සඳහා කටයුතු කල කේසර රවින්ද්‍ර මන්ත්‍රීතුමන්ට එයට මූලිකත්වය ගත් ගරු නගරාධිපතිතුමන්, නියෝජ්‍ය නගරාධිපතිතුමන් සහ සියළුම මන්ත්‍රීවරුන් ඇතුළු මොරටුව මහා නගර සභාවේ සියලුම දෙනාගේ කැපවීම ඉතා අගය කරන්නෙමු. ගරු නගරාධිපති සමන්ලාල් ප්‍රනාන්දු මැතිතුමා අප වෙතින් කරන ලද ලිඛිත ඉල්ලීමකට අනුව මොරටුව රාවතාවත්ත සුසාන භූමියේ පියාණන්ගේ ස්මාරකයක් ඉදිකිරීමට සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලාගේ ඒකමතික තීරණයට යටත්ව, අප ද කැමති ස්ථානයක එය ඉදිකිරීම සඳහා අපගේ කැමැත්ත, ඔබ සභාව වෙත ඉතා ගෞරවපූර්වකව ලබා දෙන්නෙමු. මහා නගර සභාවේ සියලුම දෙනා නැසීගිය ගායක නිහාල් නෙල්සන් අප පියාණන් වෙනුවෙන් දක්වන සහයෝගයට කෘතවේදීත්වය පිරිනමන්නෙමු.

ස්තුතියි,
මෙයට විශ්වාසී,
තරංග නෙල්සන් ගයනි නෙල්සන්

## 03 සභාව අමතා එවන ලද ආයචනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.

03(1) **මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා**

ගරු නගරාධිපතිතුමනි, පුරා අවුරුදු 15ක් පමණ මොරටුව මහා නගර සභාවේ වාර්තාකරණය කරපු මාධ්‍යවේදිනියක් වන ලංකාදිප මාධ්‍යවේදිනි රේඛා තරංගනි මහත්මියට සුවිශේෂ වූ සම්මානයක් පසුගිය දින ලැබුණා. ඒ තමයි කතෘ සංසදයත් ඒවගේම ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයත් එක්ව සංවිධානය කරපු ජනමාධ්‍යවේදින් සඳහා ඇගයීම් සහ සම්මාන ප්‍රදානය කරන උත්සවයේදි පරිසර වාර්තාකරණය සඳහා එතුමියට සම්මානයක් පිරි නැමුණා. මේක විශේෂ වන්නේ ගරු නගරාධිපතිතුමනි, මොරටුව අප මහා නගර සභාවේ වාර්තාකරණයේ යෙදෙන අතරම මීට ප්‍රථමව මේ සම්මානයෙන් පුද ලබලා තියෙන්නේ කොළඹින් දුර බැහැර ප්‍රදේශවල මාධ්‍යවේදින්. නමුත් පලවෙනි වතාවට කොළඹ ප්‍රදේශයේ පරිසර වාර්තාකරණයේ සම්මානයෙන් පුද ලබන්න එතුමියට හැකියාව ලැබුණා. එහි විශේෂයක් වෙන්නේ මම මේ සභාවේ අවධානය යොමු කරන්න සහ වටිනා කාලය ලබා ගන්නේ ගරු නගරාධිපතිතුමනි ඇයට මේ සම්මානය ලබා දිමේදි පුරෝගාමි වෙලා තිබුනේ කසල කලමනාකරණය සම්බන්ධයෙන් ප්‍රධාන විදියට, සභාවක් විදියට ගරු නගරාධිපතිතුමනි අපිටත් වටින්නේ විශේෂයෙන්ම ඔබතුමාගේ මූලිකත්වයෙන් මොරටුව මහා නගර සභාව කසල කලමනාකරණයේ අනෙක් පළාත් පාලන ආයතනවලට සාපේක්ෂව ගත්තාම ඉහලම ස්ථානයක ඉන්නවා. මෙන්න මේ කියන තත්ත්වයත් එක්ක ඒ කසල කලමනාකරණයත් ඒවගේම ඊට අදාල පාරිසරික ගැටලුත් ඉදිරිපත් කරමින් ඒ ඇගයීම විසින් ඇයට ලබා දුන්න සම්මානය අපේ සභාවටත් සභාව විදියටත් වටින්නේ ඔන්න ඔය කියන සන්දර්භය යටතේ. ගරු නගරාධිපතිතුමනි, ඒවගේම මේ අවුරුදු 15ක් අපේ සභාව නියෝජනය කරමින් ඒ මාධ්‍යවේදි මෙහෙවර යෙදෙමින් සිටින ඇයට ලැබිච්ච මේ සම්මානය සම්බන්ධයෙන් අපේ සුභාශිංශනය පලකරන අතර ඇයගේ ඒ මාධ්‍ය ජීවිතය තව තවත් සාර්ථක වේවා කියලා ප්‍රාර්ථනා කරමින් නැවත වතාවක් එය මොරටුවට ලැබිච්ච සම්මානයක් ලෙස සලකා නැවත වතාවක් එතුමියට සුභ පතනවා.

**03(2)** **<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 2023 වර්ෂය වෙනුවෙන් මොරටුව මහා නගර සභාවේ පැවැත්වෙන ප්‍රථම රැස්වීම. රටක් වැටිලා තියෙන අවස්ථාවක ගිය වසරට ගත්තොත් මේ වසර 2023 වසර අපි හිතනවා අපේ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමත් ඒවගේම ආණ්ඩුවත් සම්බන්ධ කරගෙන මේ පළාත් පාලන ආයතන තුල ඒ ජනතාවට සම්බන්ධවෙච්ච දේශපාලන ආයතනයක් වන පළාත් පාලන ආයතනය මේ මොරටු මහා නගර සභාවේ යම්කිසි වැඩක් කරගෙන යන අවස්ථාවක 2023 වර්ෂය තුල මීට වඩා දෙයක් අපි පක්ෂ විපක්ෂ හැමෝටම කරන්න පුළුවන් වේවි කියන අදහස ඇති කරමින් මේ වසර මොරටුව මහා නගර සභාවේ නගරාධිපතිතුමා ඇතුලු සියලුම නාගරික මන්ත්‍රීවරුන්ට ඒ අවස්ථාව ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. ගරු නගරාධිපතිතුමනි, මේ වෙනකොට පළාත් පාලන ආයතනය මැතිවරණ කොමසාරිස්තුමා විසින් නාම යෝජනා ඉදිරිපත් කරන්න කියලා දින වකවානු වෙන්කරලා තියෙන අවස්ථාවක ජනවාරි 18 වෙනිදා සහ 21 දින මධ්‍යම රාත්‍රී 12 වෙනකම් අවස්ථාවක් ලබා දිලා තියෙන අවස්ථාවක. නමුත් රට තියෙන්නේ මොන අවස්ථාවේද කියන එක අපි තේරුම්ගත යුතුයි. අද අපේ ජනාධිපතිතුමා පැහැදිලිවම ප්‍රකාශනයක් කරනවා එක්සත් ජාතික පක්ෂයේ ජේෂ්ඨයන්ට සඳහනක් කරලා තියෙනවා ජනාධිපතිතුමාට වරමක් ලබා දුන්නේ වැටිච්ච රට හදන්න මිසක් මැතිවරණයකට යන්න නෙමෙයි කියන කථාව ප්‍රකාශ කළා. ඒවගේම 2023 අයවැය තුල මන්ත්‍රීවරු 4000ක මුදලකට තමයි මුදල් වෙන්කරලා ඒ දිමනාව වෙන්කරලා තියෙන්නේ. ඉතින් මේ වෙලාවේ ජනතාව ඉල්ලන්නේ මැතිවරණයක්ද නැත්නම් 2023 වසරේ මීටත් වඩා ජනතාවට ආර්ථිකය ශක්තිමත් කරන්නද කියන ඒක ඒ ජනතාව කියන කථාව පැහැදිලියි. නමුත් සමහරක් සුළු සුළු පක්ෂ මැතිවරණ කොමසාරිස්තුමා කියනවා මැතිවරණයකට වැය වන මුදල කෝටි 1000ක මුදලක් කියලා. එපමණ මුදලක් මේ අවස්ථාවේදි මැතිවරණයකට වියදම් කළොත් නගරාධිපතිතුමනි එක්කෝ රාජ්‍ය නිලධාරින්ට.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ අයිතමය ආයවනා හා පෙත්සම් පිළිබඳ අයිතමය. මෙතන ඉන්න මන්ත්‍රීවරු 48 දෙනාටම මැතිවරණය සම්බන්ධයෙන් යම් යම් මත තියෙනවා. ඒ මතය ප්‍රකාශ කරන්න මේ අයිතමය යොදා ගත්තොත් ගරු මන්ත්‍රීතුමා කියන මතයට ප්‍රතිවිරුද්ධ මත තියෙන පිරිසක් මෙතන ඉන්නවා සහ ඒ හා සමානව ඇති ඒ මතය අනුමත කරන පිරිසකුත් එතකොට ඒ

සියලුදෙනා එය කථාකරන්න ගියොත් ප්‍රශ්ණයක්. ඒනිසා මේ කථා කිරීම් මේ අයිතමය යටතේ කරන්න බැරි දෙයක්. කරුණාකරලා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අදහස් ප්‍රකාශ කිරිම රීති ප්‍රශ්නයත් සමගම මතුවෙච්ච කරුණුත් එක්ක සලකලා ඔබතුමා අදහස් ප්‍රකාශ කිරිම කරන්න.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම කියන්නේ පළාත් පාලන මැතිවරණයක් මේ වෙනකොට අවශ්‍ය වෙන්නේ නැහැ කියන මතය තමයි. රට හදලා මොරටුවේ ජනතාවට යම්කිසි සහනයක් නගර සභාවෙන් හෝ රජයෙන් දෙන්න පුලුවන්නම් ආර්ථිකය ශක්තිමත් කරලා මැතිවරණයකට යාම සුදුසුයි කියන එක මම ප්‍රකාශයක් කරනවා. ඒවගේම ගරු නගරාධිපතිතුමනි, අපි හිතනවා අපිට මොරටුව මහා නගර සභාව විසුරුවන්න අවශ්‍යතාවක් නැහැ මේ අවස්ථාවේදි. මොකද හේතුව දැන් මේ නගර සභාවෙන් ඉටුවන සේවාවන් ඒ ලෙසම වෙනවා. මොකද නගර සභාව විසුරුවා කියලා රටක් වෙනස් වෙන්නේ නැහැ. ගරු නගරාධිපතිතුමනි, මේ අවස්ථාව අපි පැහැදිලිවම කිවයුතු වෙනවා නගර සභාවේ වෙන්නාවූ කටයුතු ඉදිරියට කරගෙන යමු කියන ප්‍රකාශනය කරනවා.

03(3) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජෙරාඩ් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පසුගිය මහා සභා අවස්ථාවේදි ඔබතුමාගෙන් ඉල්ලිමක් කළා ශාන්ත අන්තෝනි පාර සහ රෝසමල්කොටුවට යන මාර්ගය පිලිසකර කරන්න කියලා. ඔබතුමා කිවුවා ඒ සම්බන්ධයෙන් වැඩ කටයුතු කරලයි කියලා තියෙන්නේ. ඒ පාර සම්පුර්ණයෙන් ප්‍රතිසංස්කරණය කරලා තියෙනවා. රෝසමල්කොටුවට යන පාර බොහෝම ස්තුතියි. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ගල්පොත්ත පාරේ අංක 14 ස්ථානය මාගේ භාර්යාවගේ පියා සිටින ස්ථානය. එතන වෝටර් කටින් සඳහා ස්ථාන දෙකක් කඩලා තියෙනවා. ඉතාමත් අනතුරුදායකයි. ඒකත් ප්‍රිමික්ස් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

03(4) **<u>මහා නගර සභා මන්ත්‍රී - පී. යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම උයන ඇවිදින මංතිරුවේ ඡායාරූපගත කිරිම සඳහා සභාව විසින් යම් මුදලක් අයකරනවා. මම ඒ මුදල සම්බන්ධව කථා කරන්නේ. ඒ මුදල දවසට අපේ ගම්වාසින් ප්‍රකාශ කරපු විදියට පැය 8කට රු.5000.00 වගේ මුදලක්. ඇත්තටම ගරු නගරාධිපතිතුමනි, සමහර දරුවන්ගේ උපන්දින විශේෂයෙන්ම අවුරුද්දේ වගේ දරුවෙක්ගේ පැය 8ක් ඡායාරූපගත කිරිමක් කරන්නේ නැහැ. ඉතින් පුලුවන්කමක් තියෙනවානම් ජනතාවගේ ඉල්ලිමක් වශයෙන් කරනවා ඒක යම්කිසි තලවලට පැය 2, පැය 4ට, පැයට වගේ වෙන්කරලා යම්කිසි මුදලක් සාපේක්ෂව එකතු කළොත් මම හිතනවා අපිට ආදායම මීට වඩා හොයාගන්නත් පුලුවන්. මොකද අර කුඩා දරුවෙක්ගේ ඡායාරූපයක් ගන්න මනුස්සයෙක් කවදාවත් පැය 8 ට සල්ලි බැදලා ගන්නේ නැහැ. මොකද ඇත්තටම නොහැකියාවක් තියෙන්නත් පුලුවන්. අනෙක් පැත්තෙන් දරුවන්ට කරන සහනයක් විදියට එහෙම කරන්න පුලුවන්නම් ඒ සොයා බලලා කටයුතු කරන්න කියලා ඉල්ලිමක් කරනවා.

03(5) **<u>මහා නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 16 වන හිටපු පාප් වහන්සේ වන බෙනඩික් පාප් වහන්සේ උන්වහන්සේ ස්වර්ගස්ථ වි තිබෙනවා. මේ අවස්ථාවේදි මොරටුව මහා නගර සභාව විදියට අපි මොරටුවේ කතෝලික ජනතාව වෙත අපේ ශෝකය පල කරන්න මෙය අවස්ථාවක් කරගන්නවා. ඒවගේම ගරු නගරාධිපතිතුමනි, අපිට හැකියාවක් තිබෙනවානම් මේ සභාවේ විනාඩියක නිශ්ශබ්දතාවයක් පලකරමු කියලා ඉතාම කාරුණිකව ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, 16 වන හිටපු පාප්වහන්සේ වන බෙනඩික් පාප් වහන්සේ උන්වහන්සේ ස්වර්ගස්ථ වීම හේතුවෙන් විනාඩියක නිශ්ශබ්දතාවයක් පලකර සිටිමු.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒවගේම මීළඟට මම ඉදිරිපත් කරන්නේ සුභාශිංශනයක්. අපේ සුරේෂ් ඉන්දික මන්ත්‍රීතුමා මතුකරපු නිසා මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත්, යුතුකමක් තියෙනවා කියලා මම විශ්වාස කරනවා. ඉතාම දීර්ඝ කාලයක් මේ සභාවේ වාර්තා කටයුතු සිදුකරපු රේඛා තරංගනි මාධ්‍යවේදිනිය සම්මානයට පාත්‍රවී තිබෙනවා. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් ඒ කාරණය සම්බන්ධයෙන් සුරේෂ් ඉන්දික මන්ත්‍රීතුමා දීර්ඝව කථා කලා. නමුත්, මම මේ අවස්ථාවේදි මතු කරන්නේ එතුමා සාමාන්‍ය වාර්තාකරණයේ නියුතු මාධ්‍යවේදිනියක් පමණක් නොව අපි පහුගිය කාලය පුරාම බලාගෙන හිටියා විමසිල්ලෙන් එතුමිය විමර්ශනශිලි හා ගවේෂනශිලි මාධ්‍යවේදිනියක් වශයෙන් විශාල කාර්යභාරයක් සිදුකරනු ලැබුවා. සාමාන්‍යයෙන් මාධ්‍යවේදින් පිළිබඳව දේශපාලඥයින්ට තිබෙන්නේ වෙනත් අදහසක්. සාමාන්‍යයෙන් තමන් පිළිබඳව මොනවාහරි මතු කරනවානම් තමයි මාධ්‍යවේදින්ව අගයකරන්න පුරුදු වෙන්නේ. මේ කථාකරන අපිව අවුරුදු ගානකට කිසිම මාධ්‍යයක සදහන්වෙලා නැහැ. එහෙම අපිට අවශ්‍යතාවයකුත් නැහැ. සමහර මාධ්‍යවේදින් ඉන්නවා ගරු නගරාධිපතිතුමා මේක අවස්ථාවක් කරගන්නවා කියන්න යම්කිසි රාමුවකට කොටුවෙලා තමන්ට හිතෙන අය තමන්ට කැමති පක්ෂ ගැන පමණක් කථාකරනවා. මෙතුමිය පිළිබඳවත් අපි ඉතාම ගෞරවයෙන් මේ අවස්ථාවේ කථාකරනවා. ඉතාම ස්වාධිනව හිතවත්කම් නැතිව වාර්තාකරණයේ නියැලුනා වගේම අද එතුමිය ගවේෂනශිලි මාධ්‍යවේදිනියක් වශයෙන් සම්මානයට පාත්‍රවෙච්ච වේලාවේ මේ සභාවේ සුභාශිංශන ඉදිරිපත් කරන්න මේ අවස්ථාවක් කරගන්නවා.

**03(6) <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ විදියට අපත් රේඛා තරංගනි මහත්මියට සුභ පතනවා ඇය විසින් ලබාගත් ඒ සම්මානය පිළිබඳව විශේෂ මැදිහත්වීමක් වාර්තාකරණයේදි විශේෂයෙන් මොරටුවේදි ඇය විසින් සිදුකරනවා. ඒ පිළිබඳව අපේ ස්තුතියත් අපේ සුභාශිංශන පිරිනමනවා.

ගරු නගරාධිපතිතුමනි, පසුගිය සභාවේ සභාගත කලා ලක්ෂපතිය අර්නස්ට් පෙදෙසේ පාරක් හදලා දිම සම්බන්ධයෙන් ජනතාව කරපු ඉල්ලීමක් ඉංග්‍රිසි භාෂාවෙන් ඔවුන් ඒ ලිපිය ලියලා තිබුනේ. හැබැයි මේ වෙනතෙක් ලිපිය අදාල ස්ථානයට යොමු කරලා නැහැ. අඩුම තරමේ ඒ ස්ථානයට ගිහිල්ලා වාර්තාවක්වත් නිකුත් කරන්න. මා බැරිම තැන කොමසාරිස්තුමාට එහි පිටපතක් ලබා දුන්නා. නැවත ඉංජිනිරුතුමියට ඒ පිටපතක් ලබා දුන්නා. ඉතින් කණගාටුයි අපි ජනතාවගේ ප්‍රශ්න ඉදිරිපත් කරනවා ඔබේ අතේ පාලනය තියෙන්නේ.

ඊළගට එවැනිම ආකාරයේ සිද්ධියක් සොයිසාපුර සි5, සි1, සි3 කියන නිවාස ඒකකයන් අසලින් යන දහම් මාවතේ කෙළවර මායිමට තියෙන ප්‍රධාන කාණුව. මේ කාණුව වසර කිහිපයක් තිස්සේ නිසියාකාරව පිරිසිදු කිරිමක් සිද්ධ වුනේ නැහැ. විටින් විට ඇවිල්ලා පොඩ්ඩක් ඉඩ තියෙන ප්‍රමාණය සුද්ධ කරලා යනවා. විශාල වශයෙන් අඟුලාන පැත්තට වෙන්න තියෙන කාණුවේ අවසන් කොටස විශාල වශයෙන් හිරවීමකට ලක්වෙලා තියෙනවා ජලය බැස යන්නේ නැහැ. ජනතාව විශේෂ ලිපියක් ඉදිරිපත් කරලා තිබුණා. නමුත් ඒ පිළිබඳවත් මා දන්නා තරමින් කිසිදු මැදිහත්වීමක් මෙතෙක් කරලා නැහැ. අපි කණගාටු වෙනවා ජනතාවගේ ප්‍රශ්න විසඳන්න තියෙන ආයතනය ජනතාවගේ ප්‍රශ්න විසඳනවා වෙනුවට තම තමන්ගේ ප්‍රශ්න විසඳගන්න එක තමයි බොහෝ වෙලාවට සිද්ධවෙලා තියෙන්නේ. තම තමන්ගේ හිතවතුන්ගේ තමන්ට වුවමනාව තමන්ට වාසිය තියෙන දේවල් තමයි හැමතිස්සේම සිද්ධවෙන්නේ. ඒ පිළිබඳව අපි නැවතත් කනගාටු වෙනවා. ඒ එක්කම මැතිවරණයට තිබ්බ බය පිළිබඳවත් අපිට දැන් ඇහුණා. ඒනිසා අපි වැඩිය කථාකරන්න යන්නේ නැහැ. ජනතාවට භාරදෙමු. අපි ඉල්ලීමක් කරනවා නැවත වතාවක්

අර ඉදිරිපත් කරපු ලිපි දෙකට ඉක්මණින් මැදිහත්වෙලා කිසියම් සාධාරනයක් ඒ ජනතාව වෙනුවෙන් ඉෂ්ඨ කරන්න කියලා.

**03(7) <u>මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපේ මාධ්‍යවේදිනි රේඛා තරංගනි මහත්මියට මේ ලැබුණු සම්මානය ගැන අපි සතුටු වෙන අතර විපක්ෂයක් හැටියටත් අපි එතුමියට සුභ ප්‍රාර්ථනා කරනවා. ඒවගේම එතුමියගේ අනාගත මාධ්‍ය කටයුතු මීට වඩා සාර්ථකව කරගෙන යාමට ධෛර්ය, ශක්තිය ලැබේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා.

**03(8) <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම ඊයේ අහම්බෙන් වගේ ගියා අපේ පුස්තකාලය ජනසෙත කලා කේන්ද්‍රයට. එතන පාඩම් කරන්න තිබුන තැන උඩ, එතන දැන් අවුරුද්දකට වැඩි කාලයක් වහලා දාලා තියෙනවා. ඒකට හේතුව ඔඩිටෝරියම් එක හදන්න, එකේ වහලා හදලා තියෙනවා. නැවත වහලට අත්තක් කඩා වැටිලා වහල කැඩිලා. එතකොට දැන් ළමයින්ට පාඩම්කරන්න තැනක් නැහැ.එතන ඉන්න කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වෙනවා ඒගොල්ලෝ යම් පරිශ්‍රමයක් යොදලා පොඩි ඉඩක් හදලා තියෙනවා. ඒක ප්‍රායෝගිකව පාඩම් කරන්න පුලුවන් මට්ටමක් නැහැ. පුටු ගොඩ ගහලා එහෙම මානසික මට්ටමක් නැහැ එතන. ඒනිසා අපි අවධානය යොමු කරනවා මම ඒවෙලේම කොමසාරිස්තුමාටත් කථා කළා. නමුත්, දැන් අවුරුද්දකට වැඩි කාල සීමාවක් ඉංජිනේරු දෙපාර්තමේන්තුව ඉබි ගමනින් යනවා. ඉංජිනේරු දෙපාර්තමේන්තුව ගැන බොහෝම කලකිරීම් සහගතව තමයි කථාවුනේ. ඒනිසා ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ වගකීම ඉෂ්ඨ කරලා නැහැයි කියන එක තමයි කියන්නේ සහ නාගරික ඉංජිනේරුවරියට මේ සම්බන්ධයෙන් කථා කරන්න ගියාමත් ඉංජිනේරුවරියගෙන් ලැබෙන ප්‍රතිචාරයත් යහපත් නොවන බවයි ඒ සේවකයෝ ප්‍රකාශ කලේ. ඒනිසා නගරාධිපතිතුමා, ඔබතුමාගේ අවධානය යොමු කරලා ඒක ඉක්මනට හදලා දෙන්න කියන ඉල්ලීම කරනවා. මොකද හේතුව අපිත් පාඩම් කරපු තැන. මොකද දැන් ළමයින්ට විදුලිය කපනවා. එතන විදුලිය කැපුවත් ප්‍රශ්නයක් නැහැ හුලං ටික එනවා. හොදට ඒ වැඩේ කරගන්න පුලුවන්.

ගරු නගරාධිපතිතුමනි, මේ දැන් රනිල් වික්‍රමසිංහ මහත්මයා බලයට ආවාට පස්සේ ඔයගොල්ලෝ පත්කලාට පස්සේ ජනාධිපති හැටියට රටේ අලුත් කැබිනට් මණ්ඩලයක් පත්වුනා. ඊට පස්සේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පළාත් සභා පලාත් පාලන අමාත්‍යවරයා හැටියට මම හිතන්නේ දිනේෂ් ගුණවර්ධන අග්‍රාමාත්‍යතුමා චක්‍රලේඛනයක් නිකුත් කලා සේවක බදවා ගැනීම් සම්බන්ධයෙන්. එතකොට මේ සේවක බදවාගැනීම් කරන්න බැහැයි කියන එකයි අපේ දන්න විදියට නම් තියෙන්නේ. නමුත් දිගින් දිගටම මොරටුව මහා නගර සභාවට සේවකයින් බදවා ගැනීම් සිදුවෙනවා. එතකොට අපි අහන්නේ කොහොමද එහෙම වෙන්නේ. මොරටුව මහා නගර සභාවට දැන් මොරටුවේ මිනිස්සුන්ට ජොබ් දීලා ඉවරයි. මොරටුවේ මිනිස්සු සුඛිත මුදිත වෙලා ඉන්නේ. දැන් මීගොඩෙනුත් බදවාගෙන තියෙනවා. ජී. ඩබ්ලිව්. එල්. ලක්මාල් ප්‍රියංකර ද සිල්වා අංක 25/4 විල්ලෝරවත්ත මොරටුව පෙරේදා නැත්නම් ඊට ඉස්සෙල්ලා දවසේ පත්වීම ගැහුවේ. වික්‍රමවිරාජ් රණසිංහ අංක 438/ජී/16/ඒ2 ගුරුගේ වත්ත මීගොඩ, ආර්. එම්. සුරාජ් මයා 160/3 බෝධිය මාවත ලුනාව. 10 දෙනෙක් පොරොත්තු ලේඛනයේ ඉන්නවා කියලා ආරංචි තියෙන්නේ. අපි මේ සම්බන්ධයෙන් කරුණු විමසුවායින් පස්සේ පළාත් පාලන කොමසාරිස් වරයාගෙන් එතුමා කිව්වේ මොරටුව මහා නගර සභාව විතරක් නෙමෙයි පළාත් පාලන ආයතන වලට උපදෙස් දීලා තියෙන්නේ සාමාන්‍යයෙන් සේවකයෙක් බදවා ගන්නවානම් අත්‍යාවශ්‍ය කාරණාවකට සේවකයෙක් ගන්නවානම් ඔබතුමා අර විල්ලෝරවත්ත අයට කියලා ගස් කපා ගන්නේ ඒ කියන්නේ සේවය ලබා ගන්නවා පඩිය ගෙවනවා. එතනින් ඒ කටයුත්ත ඉවරයි. ඒ කියන්නේ බදවා ගැනීම් කරන්න පත්වීම් ලිපි ගහන්න එහෙම කරන්න බැහැ.කොන්ත්‍රාත් පදනම මතවත් බදවාගන්න බැහැ කියලා තමයි එතුමා කිව්වේ. එතකොට මේ බදවා ගැනීම් සිදුකරන එක නිතියට පිටින් තමයි මේ බදවා ගැනීම් සිදු කරන්නේ. එතකොට මේවා මේ නගර සභාවට අදාල නැද්ද? රටේ පවතින නිතිය නගර සභාවට දැන් මේ මොහොතේ අපි කියන්නේ බදවා ගත්ත කට්ටිය කාල දීර්ඝ කරනවා. ඒවා කෙරෙනවා. ඒවට අපි ප්‍රශ්නයක් නැහැනේ. මාස 6න් 6ට කාලේ දීර්ඝ කරනවා. නමුත් නව බදවා ගැනීම් සිදු කරන්න වේලාවක් නෙමෙයි මේක. එක පැත්තකින්

කියනවා මැතිවරණය තියන්න එපා සල්ලි නැහැ,පඩි ගෙවන්න සල්ලි නැහැ,වි ටික මිලදි ගන්න සල්ලි නැහැ. එක පැත්තකින් කියන ගමන් මොරටුව මහා නගර සභාවේ නගරාධිපතිවරයා සේවක බඳවාගැනිම් සිදු කරනවා කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒනිසා කරුණාකරලා අපි කියන්නේ මේ බඳවාගැනිම් වහාම නවත්වන්න. මේවා බඳවා ගන්නේ ඩෙංගු ව්‍යාපෘතිය සඳහා අත්‍යාවශ්‍ය කියලා. වැඩ කරන්නෙ ගරාජ් එකේ. බඳවාගන්නේ ලුනාව කලපුව කියලා. වැඩ කරන්නේ ගරාජ් එකේ. එතකොට ලුනාව කලපුවට එච්චර අත්‍යාවශ්‍ය නම් ගරාජ් එකට දාන්නේ කොහොමද මේ තුන්දෙනාව? මේ තුන්දෙනා විතරක් නෙමෙයි තව ඉන්නවා කට්ටිය. මේකේ ස්ථිර සේවකයන්ව පාලනය කරන්න කොන්ත්‍රාත් පදනම මත ගත්ත මිනිස්සු පරිපාලකයෝ කරගත්ත නගර සභාවක්නේ. ස්ථිර සේවකයෝ පාලනය කරන්න.මාස 6න් 6යට දීර්ඝ කරලා කොන්ත්‍රාත් පදනම මත ඉන්න සේවකයන්ව ස්ථිර සේවකයන්ව පාලනය කරන්න පරිපාලකවරයා වෙනවා. ඒනිසා කරුණාකරලා මේ බඳවාගැනිම් නවත්වන්න අපි පැහැදිලිව කොමසාරිස්තුමා ඇතුලු නිලධාරින්ට කියනවා දැන් මේ සෙල්ලම් ඇති දැන් මේ සෙල්ලම් නවත්වන්න ඕනේ. ඒනිසා මේ නගරාධිපතිවරයා කියන හැමදේම කරලා අමාරුවේ වැටෙන්න එපා. ඔබතුමාලා යටත්වෙලා ඉන්නවා රටේ නිතියට. ඒනිසා රටේ නිතිය ක්‍රියාත්මක කරන්න. ඒනිසා නිතිය ක්‍රියාත්මක කරන්න මේ මොහොතේ බඳවාගැනිම් වහාම නවත්වන්න. ඒවාට අනුමැතිය දෙන්න එපා කියන ගෞරවනිය ඉල්ලිම කරනවා.

03(9) <u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි කවුරුත් පිලිගන්නවා ආර්ථික වශයෙන් විශාල අගාධයකට වැටිලා තියෙන රටක ඒ රාජ්‍ය නායකත්වයේ සිට ආණ්ඩුවේ බලධාරින් ඇතුලු සියලු දෙනාම රාජ්‍ය ආයතනවල වියහියදම් කලයුතු ආකාරයන් සම්බන්ධයෙන් විවිධ චක්‍රලේඛන නිති අනපනත් පනවමින් තිබෙනවා.ඊට ප්‍රධාන හේතුව වෙලා තිබෙන්නේ මේවෙලාවේ පොදුවේ රටක් විදියට මුහුණ දෙමින් තිබෙන ආර්ථිකමය ගැටලුව එතනදි පළාත් පාලන ආයතනයක් ලෙස විශේෂයෙන් අපි ඉවත් කලයුතු නැත්නම් නොකල යුතු වියපිහදම් පිලිබඳවත් අපි වියදම් කලයුතු අත්‍යාවශ්‍ය සේවාවන් පිළිබඳවත් මුලික වශයෙන්ම වැඩි සැලකිල්ලට ලක්කලයුතු වේලාවක ඒසේ තවදුරටත් නොකොට තම සුපුරුදු සිතැගි පරිදිම කරගෙන යමින් තිබෙන වියහියදම් නිසා මේ සභාවේ විශාල මුල්‍යමය අපරාධයක් සිදුවෙමින් තිබෙන බව තමයි මම මේ වේලාවේ මගේ පලවෙනි චෝදනාව කරන්නේ. සෞඛ්‍ය පැත්තෙන් කවුරු කොහොම කිව්වත් ජනයාගේ සෞඛ්‍ය ආරක්ෂා කරගැනිම වෙනුවෙන් අප මැදිහත්විය යුතුයි කටයුතු කලයුතුයි අපි වියහියදම් කල යුතුයි. ගරු නගරාධිපතිතුමනි, මේ වෙනකොට මොරටුවේ අස්සක් මුල්ලක් නැර කිසි තැනක ඉන්න හිටින්න බැරි මට්ටමට මදුරු සනත්වය වර්ධනය විශාල ලෙස සිදුවෙමින් තිබෙන්නේ. එය ඩෙංගු නමින් නොවුනත් කිසි තැනක විනාඩි 5ක් 10ක් ඉඳගෙන ඉන්න බැරි මට්ටමට මදුරු සනත්වය වර්ධනය වෙනවා. නමුත් අපි අසමත් එය පාලනය කරන්න. අප ඒ වෙනුවෙන් ජනයාගේ සෞඛ්‍ය ආරක්ෂාකරගැනිම වෙනුවෙන් මේ සභාව රෝග නිවාරණය ලක්ෂ 10ක් වෙන් කරා. අපි වියදම් කලේ 374000යි. අපි ඩෙංගු රෝග නිවාරණය වෙනුවෙන් ලක්ෂ 20ක් වෙන් කලා. වියදම් කලේ 336000යි. අප වසංගත රෝග වැලැක්විම වෙනුවෙන් ලක්ෂ 100ක් වෙන් කලා. සත පහක්වත් වියදම් කරේ නැහැ. දැන් හරි පැහැදිලියි එතකොට අපි විසින් අපි ඉදිරියේ තිබෙන මොරටුව ජනයාගේ සෞඛ්‍යමය අභියෝගය ජය ගැනිම සඳහා අපි වෙන් කරන ලද මුදල්වත් අඩුම තරමේ ප්‍රමාණවත් ලෙස වැය කර ඒ කටයුත්ත කරලා නැහැ. අපි ඩෙංගු මර්දන කණ්ඩායම් යවනවා ඔවුන් යනවා පරික්ෂා කරනවා ඒ වාගේ ප්‍රතිපල මම හිතන්නේ වඩාත් ඵලදායිතාවයක් නැහැ ඔවුන්ට වැටුප් ගෙවනවා ඔවුන්ගේ සේවයට. නමුත් සතුටු වියහැකි මට්ටමක නෙවෙයි එය තියෙන්නේ. ඒනිසා මේ වෙලාවේ ඉල්ලා සිටිනවා වහාම අපි මේ වෙන්කර තබන ලද මුදල් වලින්වත් මේ මදුරු මර්දනය සඳහා ඉතාම කාර්යක්ෂම ඉතාම හොඳ වැඩ පිළිවෙලක් දියත් කරන්න. මේ වෙලාවේ ඒක ප්‍රධාන කොට ඉල්ලනවා.

ගරු නගරාධිපතිතුමනි, ඔබ අපි කවුරුත් පිලිගන්නවා අපේ බිමේ හෙට ඉගෙන ගන්න දරුවෝ මුහුණ දීලා තියෙන අතිශ්‍ය බරපතලම ගැටලුව ඔවුන්ගේ අධ්‍යාපනය සඳහා අවශ්‍ය කරන ආම්පන්න උපකරණ ලබා ගැනිමට ඔවුන්ගේ දෙමාපියන්ට අරන්දිමට තිබෙන නොහැකියාව ඒවායේ මිල ගණන් අධිකවිම දැන් අප ඒ වෙනුවෙන් ලක්ෂ 25ක් වෙන් කරනවා. නමුත් එක අභ්‍යාස පොතක් අපි දෙන්නේ නැහැ දරුවෙකුට. ඒ මුදල ලක්ෂ 25 එහෙන්ම ම තියෙනවා. ඒනිසා

ඒ පිළිබඳවත් ඉතාම දැඩි අවධානය යොමු කරන්න. ඒනිසා දැන් මහජනයාගේ අත්‍යාවශ්‍ය සේවාවන් අවම මට්ටමට හරි කරගැනීම සඳහා මේ මහජනයාගේ බදු මුදල් ටික යොදවනවා වෙනුවට රජයේ බලධාරීන් කියන රජයේ බලධාරීන් කරන්න එපා කියලා අනපනත් චක්‍රලේඛ නිකුත් කරන මේ ඉදිකිරීම් නොවැම්බර් මාසේ විතරක් ලක්ෂ 125කට වැඩිය වියදම් කරනවා ගල් අල්ලනවා එය ප්‍රමුඛව අවශ්‍යතාවය වෙන්නේ කාගේද එය ප්‍රමුඛ අවශ්‍යතාවය වෙන්නේ. තම පෞද්ගලික අරමුණු මුදුන්පත් කරගන්න බලන් ඉන්න අයගේ විනා පොදු ජනතාවගේ නොවෙයි. අප මිලියන 7ක් වෙන්කරනවා නිවාස ද්‍රව්‍ය ගෙන්න. මේවන විටත් මිලියන 9 පැනලා අපි ගොඩනැගිලි නඩත්තු වෙනුවෙන් ලක්ෂ 300ක් වෙන් කරනවා. ඒවගේ විශාල ලෙස වියදම් දරණවා. ඒනිසා මට ඒවා සංඛ්‍යා ඉලක්ක සහිතව කියාගන්න යනවාට වඩා අපි මේ කරමින් ඉන්නේ ඇත්තටම මේවෙලාවේ රට මුහුණ දීලා තිබෙන මොරටුවේ ජනයා මුහුණ දීලා තිබෙන ඇත්ත අවශ්‍යතාවය නොවන බව තවදුරටත් මේ විනාශයට වගකිවයුතු දේශපාලන වැරදි සංස්කෘතියම දිගුවක් ලෙස ගමන් කරමින් තිබෙන බව එය වහාම වෙනස් කරන්න කියන ඉල්ලීම තමයි මේ පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ බොහෝ කරුණු කාරනා තිබුණත් ඔබෙන් ඉල්ලනවා.අඩුම තරමේ අපිට පේන දුරක මේ ආයුකාලය හමාරවෙන්න නියමිතව තිබෙනවා.ආයු කාලය කවුරු මොනවා කිව්වත් මොන මොන හේතු දැක්වුවත් මේ මහා ව්‍යසනයට මේ රට ඇදලා දාපු ගොදුරු කරපු වට්ටපු මේ රටේ දේශපාලන නායකත්වය මොනවා කිව්වත් හෙට දවසේ ජනතාව තමන්ගේ ජීවත්වීමේ අයිතිය වෙනුවෙන් ඉස්සරහාට එන එක වලක්වන්න බැහැ.ඒනිසා එය ව්‍යසනයක් කරා යන්න කලින් ඒ ව්‍යසනයේ උච්චතම තැන අද අපි කාගෙත් හදවත් කඩාගෙන වැටෙන අපේ පාසලේ දොරටුව කඩාගෙන මත්ද්‍රව්‍ය අතුල්වෙලා ඉවරයි. මත්ද්‍රව්‍යවලට අපේ දරුවා ගොදුරුවෙන වෙලාවේ අපි කාටත් දැනෙන්න ඕනා දැන් දේශපාලන විරසකකම් වෙනුවෙන් හැපෙනවාද ගැටෙනවාද තම තමන්ගේ පැටිකිරියාව කියාගන්නවාද එහෙම නැත්නම් මෙය වෙනස්කරන්න අපි කලයුත්තේ මොකක්ද කියන නිවැරදි අදහසට ඇවිල්ලා වැඩ කරනවාද ඔබත් මම අපි කවුරුත් දන්නවා මේ වෙලාවේ සෞඛ්‍ය පැත්තෙන් අපි මිනිස්සුන්ට පිහිට වෙමු.දරුවන්ගේ අධ්‍යාපනය පැත්තෙන් අපි පිහිට වෙමු. මාර්ග ගොඩනැගිලි හදන එක තාවකාලිකව නතර කරමු. ඒවා කවුරුත් මැරිගෙන ඉල්ලන ඒවා නෙමෙයි. හැබැයි මිනිස්සුන්ගේ ජීවිත කඩාගෙන බිඳගෙන වැටෙනවා. සෞඛ්‍ය පැත්තෙන් දරුවන්ගේ අධ්‍යාපනය පැත්තෙන්. ඒනිසා එසේ කරන්න කියන ඉල්ලීම කරනවා.

ගරු නගරාධිපතිතුමනි, පක්ෂයක් ලෙසත් පුද්ගලිකවත් රේඛා මහත්මියට මම පෞද්ගලිකවත් සතුටුවෙනවා මාධ්‍යවේදිනියක් අභියෝග ගණනාවකට මුහුණ දෙමින් ඇයට ලැබෙන සහතික ඒ කොලය,පත්‍රය නෙමෙයි මට වැදගත් ඇය අභියෝග මැද්දේ කාන්තාවක් විදියට මේ සමාජයේ මාධ්‍ය මෙහෙවරක් කරන්න විශාල මහන්සියක් ගත්තා. හැප්පෙන්න ඕන තැන හැප්පුනා. ඔලුව පහත් කරන්න ඕන තැන පහත් කලා. මාධ්‍යවේදිනියකගේ ගුණය ඇය අපි ඉදිරියේ ප්‍රදර්ශනය කලා. ඒ වෙනුවෙන් අපි මොරටුව දීර්ඝ ඉතිහාසයක් මොරටුව තුල ඔබ කරන ලද ඒ මහා කාර්යයට අපේ ගෞරවය පිරිනමනවා.

ගරු නගරාධිපතිතුමනි ඒවගේම දිගින් දිගටම සිදුවෙන බඳවා ගැනීම් තවදුරටත් මෙහෙම කරන්න එපා ඒ බඳවා ගැනීම් නතර කරන්න. මොකද බඳවා ගන්නා ලද සේවකයින්ගේ සේවාකාලය ඉදිරියේදී අනතුරුදායක තත්වයකට පත්වෙන්න පුලුවන්. ඔවුන් පව්. ඒනිසා අනවශ්‍ය ලෙස මේ ආයතනයට මේ ආර්ථික දේහයට තව තවත් බරවල් පටවන්න එපා. දැන්වත් මේවා නිවැරදි කරගැනීම වෙනුවෙන් මේ ගෙවන අවසාන මොහොතේ හරි මුදල් නෙමෙයි නගරාධිපතිතුමා අපිට වැදගත් අපිට වැදගත් අපි කරන කාර්යයේදී අපි කොච්චරදුරට සමත්වෙලා තියෙනවාද ඒ අපේ කාර්යය සාර්ථක කරන්න නැත්නම් ඔබගේ යාන වාහන ගේදොර ඔබේ වත්කම් ඕවා වැඩක් නැහැ. කරපු දේ වටිනාකම මිලකරන්න බැහැ.මිලට තිබෙන වටිනාකම් හෙට කවුරුවත් ගණන් ගන්නේ නැහැ.

**03(10) <u>මහා නගර සභා මන්ත්‍රී - මේරීන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මම සමගි ජන බලවේගයේ සුභාශිංෂන පුදකරනවා රේඛා තරංගනී මාධ්‍යවේදිනියට ඇත්තටම කාන්තාවක් හැටියට අපිට ආඩම්බරයි ගවේෂනාත්මක මාධ්‍යවේදිනියක් හැටියට හැමවේලේම අභියෝග මැද එවැනි වාර්තාකරණය හා ඒ

සම්බන්ධයෙන් සම්මානයට පාත්‍ර වීම ඇත්තටම අපි අගය කලයුතු දෙයක්. මොකද අපි අභියෝග මැද තමයි ගොඩක් අය තමුන්ගේ රැකියාව කරන්නේ. සම්මානයක් කියන්නේ ඇගයීමක්. ඉතින් ඒ ඇගයීම ඇයට ලැබීම පිළිබඳ අපේ ගෞරවය සහ අපේ සුභාශිංෂනය ඔබතුමියට පිරිනමනවා. ඇත්තටම මම කනගාටුවෙනවා මේවගේ දෙයක් අලුත් අවුරුද්දේ සහ මේවගේ සභාවක මේ වගේ දෙයක් ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන්. අපි හැමෝම දේශපාලනය කරනවා හැබැයි අපි දේශපාලනය කොතරම් දුරට මම කියන්නේ පක්ෂ දේශපාලනයෙන් අපි කොතරම්දුරට පහත් මට්ටමට වැටිලාද හැමදෙයක් දිහාම පුළුල් ලෙස බලන්නේ නැතිව පටු කොණයකින් බලනවාද කියනවාට මීට වැඩිය මම හිතන්නේ නැහැ උදාහරණ අවශයයි කියලා. පහුගිය දෙසැම්බර් 16වන දින මොරටුව නගර සභාව ඉස්සරහා පිට සහ ස්ථාන ගණනාවක ඉදිකිරීම් කටයුතු සිද්ධවෙච්ච ඒවා විවෘත කලා. එතකොට මෙතන ළමා උද්‍යානය සහ එතන රථගාල සහ අංගනය විවෘත කලා. මම මේක සම්බන්ධයෙන් කිසිම අවස්ථාවකදී සභාවේ කථාකරලා නැහැ.හැබැයි මම හිතුවා කථාකරේ නැත්තේත් එක හේතුවක් නිසා. හේතුව අපි මොකද විපක්ෂය. අපි යම්කිසි දෙයක් කරන්න ගියාම සංස්කෘතිය වෙලා තියෙන්නේ කකුලෙන් අදින එක. විපක්ෂයට වැඩක් කරන්න බැහැ කියන එක. මම 2020 ජුලි මාසේ ඔය ළමා උද්‍යානය කරලා තියෙන ප්ලේ යුනිට් එක රෝටරි ක්ලබ් එකට ලියලා ඒක මොරටුව මහා නගර සභාවට ප්‍රදානයක් කලා. ඒ අවස්ථාවේදී මම හිතන්නේ නගරාධිපතිතුමා හිටියේ නැහැ. කොරෝනා සමයේදී කොමසාරිස් එක්ක තමයි මේ දේ කරේ. කොමසාරිස් සහ රෝටරි අංශයේ රෝටරි ක්ලබ් ඔෆ් ඉන්ෆිනිටි ක්ලබ් එකේ ප්‍රසිඩන්ට් මෙතනට ඇවිල්ලා මේ උපකරණ ටික මොරටුව මහා නගර සභාවට පරිත්‍යාග කලා. එතකොට මම ඇත්තටම කියන්න කැමතියි මේ අදහස දුන්නේ අපේ සජිත් දුමින්ද මන්ත්‍රීතුමා සහ මම දවසක් මෙතන කථාකර කර ඉන්න කොට සජිත් දුමින්ද මන්ත්‍රීතුමා මට කිව්වා මෙතන පිට්ටනියක් හදනවා මෙතන පුලුවන්නම් යම්කිසි දෙයක් කරන්න කියලා මේකට ළමයින් වෙනුවෙන් යම්කිසි දෙයක් කරන්න කියලා අපි දෙන්නා අතර වෙච්ච සාකච්ඡාවේ හැටියට මම රෝටරි එකේ සමාජිකාවක් හින්දා මම ඒ දේ ඊට පස්සේ කථාකරලා ඒ දේ කලා. එතකොම මම මේ අවස්ථාවේ සභාගත කරනවා රෝටරි සමාජය විසින් මොරටුව මහා නගර සභාවට එවපු ඊමේල්ස් මම ගාව තියෙනවා. මම මේ ලේඛනය සභාගත කරනවා. එතනින් එහාට ගිහිල්ලා මොරටුව කොමසාරිස් විසින් මෙතන ප්ලේ ගවුන්ඩ් එකේ ඉක්විප්මන්ට් සහ මේ සම්බන්ධයෙන් ගරු නගරාධිපතිතුමනි, මම මේ අවස්ථාවේ සභාගත කරනවා ඒවා ගෙනාපු පින්තූර සහ මේවා ඉන්ස්ටෝල් කිරීමට ඉන්ස්ට්‍රක්ෂන් සහ මේ හැම දෙයක්ම දීපු දේවල් මම මේ අවස්ථාවේ සභාගත කරනවා එතකොට නගරාධිපතිතුමා මේක මෙහෙම කියන්නේ අපි වැඩක් කරපුවාම මේවාට ක්‍රෙඩිට් අවශ්‍ය නැහැ.අපි වැඩක් කරපුවාම බෝඩ් ගහගන්න අවශ්‍යතාවයකුත් නැහැ. සත්භාවයෙන් යමක් කලා ඒච්චරයි. හැබැයි අපි කොච්චර පටුද කියලා මට මේක දැක්කාම තේරුනා ගමේ මන්ත්‍රීතුමා ඔසඳ මන්ත්‍රීතුමා එතන බෝඩ් එකක් ගහනවා ගරු ඔසඳ මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි ගරු පුරපතිතුමාගේ මග පෙන්වීම යටතේ මොරටුව මහා නගර සභා අරමුදල් යොදා ඉදිකරන ලද මෙම ළමා උද්‍යානය කියලා බෝඩ් එකක් ගහනවා. ඉතින් මේක මම කොමසාරිස්තුමාගෙන් ඇහුවා ඇයි මෙහෙම දෙයක් කරේ කියලා. අපි යමක් කලා. නමුත් මෙතන එතුමා බෝඩ් එකක් ගහගැනීමත් සදාචාරාත්මක නැහැ කියලා මම සභාවට ප්‍රකාශ කරන්න කැමතියි මේක රෝටරි ආයතනය විසින් ඩොනේට් කරානම් සභාවෙන් කලයුත්තේ රෝටරි ආයතනයට ස්තුතිකරලා රෝටරි ආයතනයේ බෝඩ් එකක් ගහන එක. මේක සම්බන්ධයෙන් කොමසාරිස්තුමා දැනුවත්වෙලා හිටියා. මම දන්නේ නැහැ ඇයි කොමසාරිස්තුමා මේවගේ දෙයකට මෙතන කොමසාරිස්තුමාගේ නමුත් තියෙනවා. නාගරික ඉංජිනේරුතුමියගේ නමත් තියෙනවා. මම දන්නේ නැහැ ඇයි කොමසාරිස්තුමා මෙයට අවසර දුන්නේ කියලා. මම දන්නවා එතුමා රාජ්‍ය නිලධාරියෙක්. මෙතන දේශපාලන අධිකාරිය අභිබවා එතුමන්ලා අභිබවා රාජ්‍ය නිලධාරීන් අභිබවා දේශපාලන අධිකාරිය කටයුතු කරනවා. මේකට අපි ඇත්තටම අපි අප්‍රසාදය අවස්ථා ගණනාවකදී කරලා තියෙනවා. කොමසාරිස්තුමා මේක සක්සුදක්සේ දැනගෙන හිටියා. හේතුව එතුමාගේ ලඟට ගිහිල්ලා තමයි මේ දේ භාරදුන්නේ. පින්තූර ඔක්කෝම සභාගත කරනවා. ඉතින් මට කියන්න තියෙන්නේ මෙච්චරයි මේවා ඇත්තටම සත පනහේ දේශපාලනයක්. මට එච්චරයි කියන්න තියෙන්නේ. මේක රෝටරි ආයතනය විසින් පරිත්‍යාග කලානම් රෝටරි ආයතනය බෝඩ් එකක් හරි ස්තුති කිරීමක් හරි කරන්න ඕනේ. ඒක තමයි අනෙක් එක අද ලංකාවේ මේ පෞද්ගලික අංශයේ ආයතන ගණනාවක් තියෙනවා මේවගේ සභාවල් වලට උදව් කිරීමට කැමති ඉතින් ඒවගේ දෙවල් කරන්න පුලුවන් මේ වගේ සත පනහේ වැඩ කරපුවාම ඇත්තටම අපි සභාවකත් හැටියට පක්ෂ

වෙනවා ඒ දේ කියනවා මේ සම්බන්ධයෙන් රෝටරි ආයතනයට ඉන්ෆෝම් කරනවා. රෝටරි ආයතනය මොරටුව මහා නගර සභාවට ලියයි. එතුමන්ලාගේ අප්‍රසාදය උපකරණ රුපියල් ලක්ෂ පහලවකට එහා ගිය උපකරණ ගණනාවක් අපි වැඩක් කරන කොට අපි සදාචාරයක් තියෙන්න ඕනේ. මනුස්සකමක් තියෙන්න ඕනේ. මෙන්න මේක තමයි කියන්නේ ඇත්තටම කණගාටුවෙනවා මන්ත්‍රීතුමා මෙතන නැතිවීම සම්බන්ධයෙන්. සතපනහේ දේශපාලනය කිරිම මෙන්න මේක තමයි අද ලංකාවේ මිනිස්සු ප්‍රතික්ෂේප කරන දේශපාලනය. මම 2020 ජුලි මාසේ මේක සභාවට දිලා අද වෙනතුරු මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රකාශයක් කරෙත් නැත්තේ මේ හේතුව හින්දා. මේවා රජයේ ආයතන නෙමෙයි දේශපාලන අධිකාරි විපක්ෂයේ අපි මේවා දුන්නා කියලා කිව්වානම් අපිට අපේ නම් ගහගන්න කිසිම අවශ්‍යතාවයක් නැහැ. නම් ගහගෙන පටු දේශපාලනය කරන්නෙත් නැහැ.කරනවානම් මීට ඉස්සෙල්ලා කථාකරලා අපි දුන්නේ කියලා. කියලා ඔය බෝඩ් එක ගහනවා. අපිත් එතන මම කියන්නේ එකයි රෝටරි ආයතනය දුන්නානම් රෝටරි ආයතනයට ස්තුතිකරලා එතන බෝඩ් එකක් ගහන්න. ඊට පස්සේ නගරාධිපතිතුමා මම ඉල්ලීමක් කරන්න කැමතියි කරුණාකරලා රෝටරි ආයතනයට එගොල්ලෝ ලියයි ඒගොල්ලන්ගේ අප්‍රසාදය පලකරලා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් නිසි පියවර ඔබතුමා අඩුමගානේ දේශපාලන නායකයෙක් වුනාට ඔබතුමාට යමක් දෙස පුළුල්ව බලන්න පුලුවන් කියලා මම විශ්වාස කරනවා. ඔබතුමා මේ සම්බන්ධයෙන් කටයුතු කරයි කියලා බලාපොරොත්තු වෙනවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, විශේෂයෙන් මම හිතනවා මේකට පිළිතුරු දෙනවා නෙමෙයි වරදවා වටහා ගැනිමක් තුල විවෘත කිරිමේ එලකයේ තියෙන මෙතුමිය කියන එකයි දෙකක්. ඒනිසා විශේෂයෙන්ම ගරු මන්ත්‍රීතුමිය ඕකේ තියෙන්නේ ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම මත කියලා තියෙන්නේ මන්ත්‍රීතුමා වියදම් කලා සභාවේ අරමුදලුත් තියෙනවා ඔතන සභා අරමුදල් කොතනද තියෙන්නේ කියලා මම කියන්න යන්නේ නැහැ. සභා අරමුදල් තියෙනවා. සභා අරමුදල කියද කියන එක කියන්න යන්න එපා. සභා අරමුදල් වැය කරලා තියෙනවා. ඒ වැය කරපු මුදල ලක්ෂ 5කට වැඩියි. ඕක විවෘත කලේ මේකත් එක්ක විවෘත කරන්න ඕන නිසා. ඕකට එනවා කාපට් එකක්. ඒ කාපට් එක ඕඩර් කරලා ඉවරයි. සභා අරමුදල් කියන එක රුපියලක් වැය කලත් සභා අරමුදල්. වරද්දගෙන තියෙන්නේ රෝටරි එකට ඇත්තටම ඔච්චර උනන්දුවෙලා වැඩේ කලානම් කියන්න තිබුණා මේ සභාවට මේකේ තියෙන්නේ නාගරික මන්ත්‍රීතුමා මැදිහත්වෙලා. මොකද ඔබතුමිය සභාවේ ඇත්තේත් නැහැ නාගරික මන්ත්‍රීතුමා උද්‍යානයක් ඕන කියනකොට මේතුමා ඔය ව්‍යාපෘතිය පටන්ගන්න ඉස්සේල්ලා අවුරුදු 3 - 4කට උඩදි අංගසම්පූර්ණ ළමා උද්‍යානයක් ඕන කියලා යෝජනාව දුන්නේ 2014.

**<u>මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, යෝජනා කරන්න පුලුවන් රටෙත් මිනිස්සු යෝජනා කරනවා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය බලන්නකෝ තියෙන්නේ මොකක්ද කියලා. ඕකේ පොඩි වරදක් තියෙන්නේ. තියෙන්නේ ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි ඉල්ලීම පරිදි ඕන කෙනෙකුට කරන්න පුලුවන් ඉල්ලීම. නැත්නම් කොහොමද උද්‍යානයක් එන්නේ. සේනක මන්ත්‍රීතුමා තේරුම් ගන්නවා ඇති ඔබතුමා යෝජනාවක් දැම්මොත් තමයි පළාත් සභාවේ සල්ලි දෙන්නේ.මන්ත්‍රීතුමා යෝජනාවක් කරපු නිසා තමයි ඔබතුමියගේ ඉල්ලීමක් හම්බනවුනේ රෝටරි එකට බඩු දෙන්න කියලා. එක තමයි අපි දාලා තියෙන්නේ.ඒය වරදක් දැන් මම කියනවානේ දැන් ඕකේ එක පැත්ත දෙපැත්ත මම මේකට මැදැහත්වුන නිසා මගේ නම දාලා නැද්දෝ කියන එක නෙමෙයිනේ ඔබතුමිය කිව්වේ.මේක අනුග්‍රහය රෝටරි ආයතනය ලබා දුන්නා කියන එක කියනවානම් ඒ ආයතනය දුන්නා කියලා කියනවානම් ඒක හොඳයි නරකයි කියන්න නෙමෙයි උස්සාහ ගන්නේ.හැබැයි මොන විදියකවත් මන්ත්‍රීතුමා නම දාගෙන කියන එක කියන්න එපා.ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාව මත තමයි ඕකේ ඉදිකිරිමට අවශ්‍යවන භූමිකාව හැදෙන්නේ.මන්ත්‍රීතුමා නම දාන්න කිව්වේ නැහැ.ඔබතුමියලා හැදුවා අපි විවෘත කරා. හයිවේ අපි

හැදුවා ඔබතුමියලා විවෘත කරා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ඉල්ලපු වකුගඩු රෝහල අපි හැදුවා. එතුමා විවෘත කරා. එහෙම වෙන්න පුලුවන්. හැබැයි ඉල්ලීම පැහැදිලිවම මම හිතනවා වරද තියෙන්නේ කොතනද කියන එක හඳුනගන්නේ නැතිව නිතිඥතුමිය කියනවානම් සත පනහේ වැඩ රුපියලේ වැඩ කියලා, කථාව තමයි සත පනහේ සත විසිපහේ වැඩ වෙලා තියෙන්නේ. ඒක නිසා ගරු මන්ත්‍රීතුමිය, ඉල්ලීම මත කලා කියන එක දාන්න ඕන. මොකද ඒ මන්ත්‍රීතුමිය මම හිතන්නේ ඔබතුමිය තරග කරනවාදෝ පළාත් පාලන ආයතනයකට කියන එක හිතන්නේ නැති කාලෙක එතුමා යෝජනාව දැම්මේ.

03(11) <u>**මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අපි සතුටුවෙන කාරණා දුක්වෙන කාරණා පිළිබඳව කථා කලා. ඒවගේම අදත් අපිට සතුටුවෙන්න තිබ්බ කාරණාවක් අපිට දුක්වෙන කාරණාවක් බවට පත්වෙලා තියෙනවා. ඒ තමයි අපේ මහා නගර සභා හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයෙන් ආරම්භ කරන්න තිබුණු 0.01 පොලියට ලැබෙන අවුරුද 40කින් ගෙවීම් පටන්ගන්න තියෙන සැහැල්ලු දුම්රිය අද දවසේ තමයි පලවෙනි අත්හදා බැලීම් වටය කරන්න තිබුනේ. ඒවගේම මාර්තු මාසයේ තමයි ඒක ආරම්භ කරන්න තිබුණේ. ඒනිසා අද අත්හදා බැලීම් කරන්න තිබ්බ සැහැල්ලු දුම්රිය මෙම උද්‍යානය උඩින් තමයි එක නැවතුම්පලක් විදියට තියන්න තිබුනේ. ඒක අපිට අහිමි වෙලා තියෙනවා. ඒත් එක්කම ගරු නගරාධිපතිතුමනි, අපි සතුටුවෙනවා කොහොමහරි අපි යහපාලන ආණ්ඩුවෙන් මහා නගර සහ බස්නාහිර පළාත් අමාත්‍යාංශයෙන් විශේෂයෙන් මහා භාණ්ඩාගාරයේ මුදල් නොමැතිව කොටි 3900ක් පාඩු වෙලා තිබුණු නාගරික සංවර්ධන අමාත්‍යාංශය කෝටි 3900 පාඩුව පියවලා කෝටි 2400ක් ලාභ කරලා ඒකේ ආයෝජනයක් විදියට තමයි ඔබතුමා මෑතකදි විවෘත කරපු කටුබැද්ද පොළත් ඒවගේම මේ පුරන්අප්පු උද්‍යානයේ චතුරස්‍රයත් විවෘත කලේ. අපි විවෘත කිරිම සම්බන්ධයෙන් සතුටුවෙනවා. හැබැයි ඔබතුමා එතනදි අමතක වුන කාරණාවක් තිබුණා ඒවගේම ඔබතුමා යම් වෙලාවකදි අමතක කරන්න බැරිකමට කියපු ටිකකුත් තිබුණා. අතිතයෙන් තොර වර්තමානයකුත්, වර්තමානයෙන් තොර අනාගතයකුත් නැහැ කියලා. ඒනිසා මහා නගර සහ බස්නාහිර පළාත් ඇමතිතුමන් පාඨලි චම්පික රණවක මැතිතුමන්ගේ ඒ ඉල්ලීම පිට මේ සියලු දෙනාගේම සහයෝගය පිට අපි ඔබතුමාලාගෙත් එකමුතුවෙන් අපි හැදුවා. හැබැයි ඒකට බොහෝදෙනා කිව්වා මේක බලු නකුටක්. ඒනිසා මාකට් එක හැබැයි සමහර වෙලාවට බලු නකුට කිව්ව කට්ටිය බලු මයිලකටවත් සම්බන්ධ නොවී අපේ නම ගහගන්න ඕන නැහැ අපි ආරම්භයෙත් එහෙම කලේ නැහැ. ඒනිසා නම් නැතිව මාකට් එක විවෘත කලා. ඊලගට මෙතන උද්‍යානයත් එහෙම විවෘත කලා. ඒ උද්‍යානය තුල තිබුණා විශේෂයෙන් යට රථවාහන අංගනය වගේම උඩ තිබ්බ ළමා උද්‍යානය. ඒත් එක්කම විවිධ අරමුණු සඳහා පාවිච්චි කරන්න පුලුවන් කාරණාවක් වගේම අනෙක් පැත්තෙන් මෙතනින් යන සැහැල්ලු දුම්රිය සේවය. ඒවගේම එහා පැත්තෙන් පටන්ගන්න ටුවින් ටවර් එක වගේ තියෙන සියලුම ගොඩනැගිලි ඒත් එක්කම මේවාට පබ්ලික් ප්‍රයිවට් පාර්ට්නර් ෂිප් වගේම ප්‍රංශයේ ලැබිච්ච සමහරක් ආයෝජනත් එන්න තිබුණේ. ඒනිසා කෙසේවෙතත් අපේ නම් නැතිවුනාට කමක් නැහැ මේක ජනතාවගේ මුදල් අපි අමාත්‍යාංශ ලාභ කරලා ඒක ගෙනාවා. ඒක වෙනම කාරණාවක්. ඒනිසා ඒක ආරක්ෂාකර ගැනිම මොරටුව පුරවැසියන්ගේ අපි ඔබතුමාගේ ඒ අත්තනෝමතික ක්‍රියා නිසා තමයි අපි ප්‍රධාන වේදිකවටවත් ආවේ නැත්තේ ඒනිසා. ගරු නගරාධිපතිතුමනි ලිහිණි මන්ත්‍රීතුමියට මම ස්තුතිවන්ත වෙනවා මේකට සැලසුම් කරලා තිබ්ච්ච ඒ සෙල්ලම් උද්‍යානය මේ කවුරුත් කියලා හදපු එකක් නෙමෙයි. එතුමිය තමයි ඒක සම්බන්ධිකරණය කරලා කලේ. එතුමියට ස්තුතිවන්ත වෙනවා. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, ඊලගට අපි කියන්නේ අපිට අහිමිවෙච්ච ව්‍යාපෘති ටිකක් තියෙනවා අනාගතයේ හරි කමක් නැහැ මේ සැහැල්ලු දුම්රිය ගේන එක ඔබතුමාට කරන්න පුලුවන්නම් අන්න ඒක ලොකු දෙයක්. ඒවගේම අපි අත්හැරලා දාපු මැටිවත්තේ නිවාස ව්‍යාපෘතිය ඔබතුමාට ගේන්න පුලුවන්නම්.

<u>**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, ගේනවා. හෙට අනිද්දා මුල්ගල තියනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඒවගේම ඔබතුමා පොලිස් ස්ථානය හදනවා කියලා කිව්වා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මේවා කඩන්න හැදුවේ අපි නෙමෙයි පොලිසිය කඩන්න හැදුවේ අපි නෙමෙයි. ඒනිසා බොරු කියන්න එපා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපි ඒ කාලේදි සැලසුම් කරපු කාරණා ගෙනල්ලා තියෙනවා. නමුත් අපි සංතෝශ වෙනවා අපි කාගෙත් නම් නැතිවුනාට ඒ ජනතාව වෙනුවෙන් තියෙන එක සුරක්ෂිත කරලා කටයුතු කරන්න. ඒක තමයි වැදගත් වෙන්නේ. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, ඉතුරු ව්‍යාපෘති ටිකත් මම කියන්නේ ගේන්න. ඒනිසා මම ලිහිණි මන්ත්‍රීතුමියටත් චම්පික රණවක ඇමතිතුමාටත් ඒ සඳහා දායකත්වය දුන්නු හැමෝටම ස්තුතිවන්ත වෙනවා. මොරටුව ජනතාවට මේ තිළිණය ආරක්ෂා කරලා ඉදිරියට ගෙනයන්න ඕනේ. ඊලග කාරණාව තමයි මේ පාසලේ තාප්පය. ඒ ව්‍යාපෘති කරපු කෙනා බැදලා දුන්නා ඒත් එක්කම ඔබතුමාට මතක ඇති විල්ලෝරවත්තට හම්බවෙච්ච වේදිකාව ඒ වේදිකාව ලැබුණා ඒකේ ප්‍රතිලාභ විදියට.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, නිශාන්ත ප්‍රදිනාන්දු මහතා මේ සභාවෙන් කිහිපවිටක්ම අහලා තියෙනවා ඔය දෙන්න යන එක අපිට දෙනවාද කොහොමද කරන්නේ ඒ ලියවිල්ල අතේ තියෙනවාද එක ඇහුවේ එතුමා විතරයි යූඩී එකට ඕන ඕන දේවල් කරන්න බැහැ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, නගරාධිපතිවරයා විදියට ඔබතුමා සම්බන්ධ වුනානේ ඒවාට. කොහොමහරි දැන් විවෘත වෙලා තියෙනවා. ඒ විවෘත වෙච්ච එක නගර සභාවට ලැබිලත් තියෙනවා. යූඩී එකට ලැබිලා නැහැනේ. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, මේ ගෙන්න ඊලග කාරණාව තමයි අපි මොරටුව ප්‍රදේශයේ ලාදුරු යම් ප්‍රමාණයකින් වැඩි වෙලා තියෙනවා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් පහුගිය ටිකේ යම් ව්‍යාපෘතියක් ඉටු කලා.

**<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි දෙදෙනා එකතුවෙලා කරපු වැඩසටහන් වලට පරික්ෂණ කරන්න යනකොටත් අපිට කිව්වාම අපි ඇම්බියුලන්ස් එක දුන්නා. තෙල් දුන්නා. ඒ පරික්ෂාවල් ප්‍රාදේශිය ආර්ඩී ඒ කියන්නේ කොළඹ දිස්ත්‍රික් ඒරියා එකේ ඩොක්ටර් විශේෂඥ වෛද්‍ය ගජනායක මැතිතුමා වරින්වර කථා කරලා අවසාන එක තිබ්බෙත් ලූනාව රෝහලේ කන්න දුන්නා කියන එක නෙමෙයි දිවා ආහාරය, උදේ ආහාරය තේ දිලා ඔක්කෝම දිලා ඔවුන්ට ශක්තියක් වුනා මේ සභාව. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය කරපු එකක් නෙමෙයි. විශේෂඥ වෛද්‍යවරයා හා වෛද්‍යවරුන් එකතුවෙලා තමයි මේ වැඩේ කලේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා මම කියනකම් හිටියේ නැහැනේ. දැනුවත් කිරීම් වැඩ සටහනක් කරා වගේම නගර සභාවෙනුත් දායකත්වයක් ලබා දුන්නා ගජනායක මහත්තයත් විශාල දායකත්වයක් ලබා දුන්නා. ඒවගේම අපේ ඉන්න ප්‍රධාන MOH ඉන්න නිලධාරිතුමන්ලා ඒවගේම නගරාධිපතිතුමනි මේක අඩුකරගන්න කටයුතු කරනවා වගේම ආහාර උද්ධමන ප්‍රශ්නට මේක අපේ බරපතල විදියට අපේ සමාජය මුල් බැසගෙන තියෙනවා මිනිස්සුන්ගේ දරිද්‍රතාවය,

මන්දපෝෂණ තත්ත්වය. ඒනිසා ඒත් එක්කම ඒ මන්දපෝෂණය හැදිච්ච ළමයින්ට ඩෙංගු විදිනවා වගේ අද වෙනකොට මේ අපේ නගර සභාවේ වැඩකරන සේවකයෙකුගේ දරුවෙකුටත් හැදිලා තියෙනවා. මෙතුමා ඊයේ දුම්ගැසීමේ ක්‍රියාවලියට ගියා. ස්තුතිවන්ත වෙනවා නගර සභාවේ සියලු දෙනාට. ඒනිසා ගරු නගරාධිපතිතුමනි මන්දපෝෂණය හැදිලා, එක පැත්තකින් ලාදුරු හැදිලා, මිනිස්සුන්ට අනෙක් පැත්තෙන් ඩෙංගු විදිනවා වගේ වැඩක් වෙන්නේ. ඒනිසා මේක සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න යම් සාමුහික වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා. මොකද මේකට අපි ඔබතුමාට දොස් කියනවා නෙමෙයි ඔබතුමාට අවශ්‍ය විදියට අපි සහයෝගය දීලා තියෙනවා. ඒවගේම අපේ අදහස් දීලා තියෙනවා. සමහර වෙලාවට ඔබතුමා ක්‍රියාත්මක කරලා තියෙනවා. මම කියන්නේ ඒකේදි අපි සාමුහිකව මේ වැඩසටහනට මුහුණ දෙන්න ඕනේ. ඒනිසා අද ලාදුරු, ඩෙංගු, මන්දපෝෂණය මේ මොරටුවේ දරුවන්ව වෙලාගෙන තියෙනවා. ඒ සඳහා නිශ්චිත වැඩසටහනක් ඕනා. අනෙක් පැත්තෙන් අධ්‍යාපනය පැත්තෙන් කථාකරා සමහර වෙලාවට පොත් 8ක් නෙමෙයි එක පොතක් ගන්න බැරි තත්වයට හිගමන තත්වයට අපි ඇද වැටිලා තියෙනවා. මේ සඳහා නිශ්චිත ක්‍රියාමාර්ගයක් වැඩ පිළිවෙලක් අවශයයි. ඒකට අවශ්‍ය කරන වැඩ පිළිවෙලවල් සර්වෝදය වේවා යුනිසෙෆ් හෝ වේවා අනික් සංවිධාන එකතු කරගෙන කටයුතු කරන්න කියන එක අපි ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, මොරටුවේ ගවේශනාත්මක ප්‍රවෘත්ති කලාව උදෙසා රේඛා තරංගනී මහත්මියට පරිසරය සම්බන්ධයෙන් ලැබෙන අතරවාරයේදී අනෙක් පැත්තෙන් අපේ පියුමි ෆොන්සේකා මහත්මිය නගර සභාවේ හිටපු ප්‍රසිද්ධ නිවේදක උපතිස්ස ෆොන්සේකා මහත්මියගේ දියණියක්. එතුමියට ලැබෙනවා ගවේශනාත්මක ප්‍රවෘත්ති කලාව සම්බන්ධයෙන් සම්මානය. අනෙක් පැත්තෙන් ලැබෙනවා අපේ රේඛා මහත්මියට පරිසරය සම්බන්ධයෙන් සම්මානය. ඒ නිසා විශේෂයෙන්ම මේ දෙදෙනා පිළිබඳවම මතක් කරන්න ඕනේ. එකක් තමයි එහිදි ඇගයිමට ලක්වුනේ අපේ ප්‍රවෘත්තිකරණයේ තියෙන පරිසර පැත්තත් ගවේශනාත්මක ප්‍රවෘත්ති පැත්තත් අතර තියෙන ප්‍රධාන ගුණාංග සියල්ලක්ම මොවුන් දෙදෙනා විසින් රැකලා තිබුණා. ඒතමයි ප්‍රවෘත්තියක තියෙන්න ඕනේ නිරවද්‍යතාවය, නිරවුල් භාවය, ප්‍රේක්ෂකයාගේ විශ්වාසනියත්වය සම කරලා තියෙනවා. ඒ න්‍යාය හොඳින් අත්දැකලා තිබුණා. ඒනිසා අපි ඇමරිකාවේ පත්තර ගත්තත් ඒවගේම අනෙක් පත්තර ගත්තත් තියෙන ගුණාත්මකභාවය දැකපු පරිසර වාර්තාකරණයෙන් රේඛා මහත්මියත් අනෙක් පැත්තෙන් ගවේශනාත්මක ප්‍රවාත්ති කලාවේ මොරටුව නගර සභාවේ මොරටුව එගොඩඋයන පදිංචි ඒ පියුමි ෆොන්සේකා නැගණිය ජයග්‍රහනය කරලා තිබ්බා. ඒනිසා ඒ ගුණාත්මකභාවය රැකගෙන ප්‍රවෘත්ති කලාව හෝ වේවා ඒවගේම ජනමාධ්‍යයේ තිබෙන ඒ අපූර්වත්වය ඒත් එක්කම පරිසරය පැත්තේන් තියෙන ඒ ජෛව විවිධත්වය ඒවගේම දේශගුණික විපර්යාස කාලගුණික විපර්යාස ඒවගේම ආවේණිකත්ව ශාඛ, සතුන් පිළිබඳව වගේම පරිසරයේ තියෙන විවිධත්වය පිළිබඳ හරියටම තක්කේට ඒ නිශ්චිත ආකාරයෙන් ඒ ගුණාංගත් එක්ක ලියපු රේඛා තරංගනී මහත්මියටත් පියුමි ෆෝන්සේකා නැගනියටත් අපි සුභාශිංශනය පලකර සිටිනවා.

**03(12) <u>මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්. ඒ. දෝන දිලාශිනි මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි,පලමුව රේඛා තරංගනී මාධ්‍යවේදිනියට අපි සුභාශිංෂනය පුදකරනවා. 2018 නවක මන්ත්‍රිවරුන් හැටියට අපි පත්වුනාට පස්සේ අභියෝග රාශියකට නවක මන්ත්‍රිවරුන් හැටියට අපිට මුහුණ දෙන්න සිද්ධවුණා. මම හිතන්නේ ඉතිහාසයේ වෙච්ච සිදුවීමක් ඒක ගරු නගරාධිපතිතුමනි 2018න් පසුව පාස්කු ප්‍රහාරයත් ඒවගේම මේ කොරෝනා වසංගත කාල සිමාවත් ඒ එක්කම අරගල ඇතුලු ඒ සියලුම කටයුතු නිසා රට ඇත්තම කිව්වොත් අගාදයට යම්කිසි පසු බැසිමක් හැම අංශයකින්ම පසු බැසිමට ලක්වි තිබෙන මොහොතක් තමයි මේ අපි ගත කරන්නේ. ඉතින් නව වසරක් උදාවුනා. මේ නව වසරේදි විශේෂයෙන් කිවයුතුයි අපි එකරාශිවෙලා ඔක්කෝම විශේෂයෙන් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රිවරුන් පක්ෂ විපක්ෂ සියලු දෙනාම අර පැත්තෙන් මේ පැත්තටත් මේ පැත්තේන් එ පැත්තටත් දෝෂාරෝපනය කරන එක මම දැක්කා. මම නවක මන්ත්‍රිවරියක් හැටියට මම යමක් ඉගෙන ගැනිමට එගෝල්ලන්ගේන් බලාපොරෝත්තුවුනා. යම් දෙවල් ඉගෙන ගත්තා. ගරු නගරාධිපතිතුමනි නමුත් ඉදිරියේදි ගරු ජනාධිපතිතුමා කියන ආකාරයටම ඔක්කෝමලා එකරාශිවෙලා මේ ගමනක් යන්න ඕන අවස්ථාවක් මේක. කිව යුත්තේ මේ වසරේදිවත් මන්ත්‍රිවරුන් හැමෝම එකරාශිවෙලා එකතුවෙලා

මේ දොස්තැබීම සභාවාරයකදී පොඩ්ඩක් අඩුකරලා කාලය යමක් කිරීමට සංවර්ධනය කිරීමට ව්‍යාපෘතියක් කිරීමට කාටහරි සේවයක් කිරීමට ඒ කාලසීමාව කැප කරලා එහෙම වුනොත් මේ අවුරුද්දේ අපිට යම් ඉහලට ඒමක් අපිට දැකගන්න පුලුවන්.

ගරු නගරාධිපතිතුමනි, සොයිසාපුර මුළු මොරටු පුරවරයේම මේ පදික වෙළඳුන් වැස්සට තෙමෙනවා. අව්වට වේලෙනවා. ඒ මිනිස්සුන්ට ලාභයක් ලබන්න ව්‍යාපාරයක් කරනවා වගේම ඒ අය ආසයි ලස්සන වෙළඳාමක් කරන්න පදික වෙළඳාමේදී නම් හැමදාමත් පදිකවේදිකාවේ නැතිව පුංචි කඩ කාමර කැල්ලක හෝ වෙළඳාමක් කිරීමට තාමත් ඒ අයගේ බලාපොරොත්තුවක් තියෙනවා ගරු නගරාධිපතිතුමනි ඔබතුමා එය ඉෂ්ඨකර දෙයි කියලා බලාපොරොත්තු වෙනවා. අඩු තරමේ මේ වසරේ හෝ ඊලග වසරේ හෝ අඩිකාලම් දමා ඒ වෙළඳුන්ට සහනයක් ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා. ඒවගේම ගරු නගරාධිපතිතුමනි මේ අලුත් අවුරුද්දේ කටයුතු රාශියක් ඉදිරියට කිරීමට තියෙන මේ වසර මා හිතනවා මේ වසර ඇතුලත මොරටුවට මීට වැඩිය කල දේ බොහෝමයි නමුත් කලයුතු දෙත් බොහෝමයක් තියෙනවා. ගරු නගරාධිපතිතුමනි ඒ සියලුදේම සාර්ථක කරගෙන මේ වසර ඇතුලත හුගක් අපි මේ ආපස්සට ගිය රටේ තියෙන තත්වය මොරටුව නගර සභාවේ සභිකයින් හැටියට යම් දායකත්වයක් දීලා මේ දෝෂාරෝපනය කිරීම් බැන අඩගැසීම් ටික කාලයකට හෝ නවත්වලා යම්කිසි වැඩක් කිරීමට ඔක්කෝම එකරාශිවෙලා වැඩක් කිරීමට ව්‍යාපෘතියක් කිරීමට ඒ කාලය කැප කරලා වුනොත් අපිට යම්කිසි සුභදායක තත්ත්වයකට එන්න පුලුවන් කියලා මා විශ්වාස කරනවා. සියලු දෙනාමට මේ ලැබුවාවූ අලුත් අවුරුද්දට සුභ පාර්ථනා කරනවා.

**03(13)** **<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩී. අනුර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙන්න ඕනේ මොරටුව නගර සභාවේ සියලු මන්ත්‍රීතුමන්ලාට හා ඔබතුමාට. මොකද කටුබැද්ද වෙළඳපොල විවෘත කිරීමේ උස්සවයට අපේ සජිත් දුමින්ද පිරිස් මන්ත්‍රීතුමා සහභාගී වුනා. බොහෝම ස්තුතියි මොකද එතුමාටත් මම පොඩි කුහකකමක් ප්‍රදර්ශනය කලාට මටනම් ඉතින් මගේ නම ඕකේ කොටන්න ඕනෙ නැහැ. ගමේ මිනිස්සුන්ගේ හදවත්වල කොටලා තියෙන්නේ. මිනිස්සුන්ගේ ලොකු මතයක් ගියා නගරාධිපතිතුමනි ඔය හදන මිනිස්සුන්ට තමයි ගිහින් කිව්වේ මේවා දෙන්නේ දේශපාලඥයින්ට විතරයි කඩ කාරයන්ට කඩ හම්බවෙන්නේ නැහැ කියලා. නමුත් අපි ඒක විනිවිද භාවයකින්ම ඒ අවශ්‍යා මිනිස්සුන්ට ඒ කඩ අයිතිකාරයන්ට කඩ දුන්නා. අද මම හිතන්නේ සියලුම කඩවලට සල්ලි බැදලා ඉවරයි. සමහර ඔය කථා හදපු මන්ත්‍රීවරුම කිව්වා යමු මානව හිමිකම් කියලා. නමුත් එක කඩ හිමියෙක්වත් මානව හිමිකම් යන්න ආවේ නැහැ. ඉතින් ඒක නිසා ඇත්තටම අපි සංතෝශවෙනවා අපේ කටුබැද්දේ ඇත්තටම අපේ විපක්ෂ මන්ත්‍රී සේනක දමයන්ත මන්ත්‍රීතුමා ඔය කිසිකෙනෙක් කිසිම අනුබලදීමක් කිසිම තැනකින් විරෝධතාවයක් කලේ නැහැ. මොකද අපි ඇත්තටම දුන්නේ සම්පූර්ණ විනිවිදභාවයකින් කඩ හිමියන්ට පමණයි. අදටත් තියෙනවා කඩ 4ක්ද 5ක්ද ඒවා විවෘත ටෙන්ඩරයකින් දෙන්නේ ගමේ මිනිස්සු ටික සාර්ථකව ව්‍යාපාර කරන්න කැමතිවෙලා තියෙනවා. විශේෂයෙන් මේ කඩටික අරිනකොට උත්සවයකුත් තියන්න තරම් පොරොන්දුවෙලා තියෙනවා. නගරාධිපතිතුමනි මාකට් ඒකේ තව අඩුපාඩු වගයක් තියෙනවා. මොකද බක්කි හිමියන්ට ඒක එක කට්ටිය ගිහිලා කියලා තියෙනවා ඒ බක්කි එගෝල්ලන්ට දෙන්නේ නැහැ. ඒනිසා නගරාධිපතිතුමනි ඉක්මනින් ඒ බක්කි ටික හදලා අපේ ඒ ඉන්න ව්‍යාපාරිකයන්ට දෙන්න කියලා ඉල්ලීම කරනවා .

**03(14)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. කේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, රාවතාවත්ත ආදාහනාගාරයේ එක් යන්ත්‍රයක් කාර්මික දෝෂයක් වෙලා තිබුණා. ඇත්තටම නගරාධිපතිතුමා ඔබතුමාගේ ඉල්ලීමත්,ඔබතුමාගේ උනන්දුවත් නිසා ඒම යන්ත්‍රය දින 6ක් තුලදී මට නිමාකරන්නට ලැබුණා. එක කරන්න මම ඔබතුමාගෙන් ගොඩක් බැනුම් ඇහුවා. එකෙන් සේවාවල් වෙනකොට මට පුදුම සතුටක් දැනුනා. මට ඒ සේවය ලබා දීමට ඔබතුමාගෙන් ලැබුණු සහයෝගයට ඔබතුමන්ට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.ඒවාගේම එගොඩඋයන ආදාහනාගාරයේත් එහෙ අලුත්වැඩියාවක් කිරීමට හැකිවුනානම් හොඳයි

**03(15)** **<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා</u>**

ගරු නගරාධිපතිතුමනි, සුභාශිංෂන පිරිනමනවා රේඛා තරංගනි මාධ්‍යවේදිනියට දිර්ඝ කාලයක් අවුරුදු 15ක් වැනි කාලයක් සිට මෙම මහනගර සභාවේ ප්‍රවෘත්ති වාර්තාකරනයේ යෙදෙනවා. එතුමිය විවිධ දුෂ්කරතා බාධක මැද්දේ ඒවගේම එතුමියගේ ඇතැම් අසනිප අමතක කරලා මාධ්‍යට තමන්ගේ රැකියාවට වෘත්තියට මුල් තැන දිලා කටයුතු කරන මාධ්‍යවෙදිනියක් විදියට පරිසරයෙන් ඒ ලද වාර්තාකරනයෙන් ලද සම්මානය එතුමියට ලැබිම සම්බන්ධව හදවතින්ම ස්තුතිවන්ත වෙනවා. සුභපතනවා. ඒවගේම එතුමිය පහුගිය කාලේ අපි දැක්කා මේ වාර්තාකරනයට එන්නෙත් බොහෝම අසිරු තත්වයක ඉදලා ඒනිසා අපි මාධ්‍යවේදින් ගැන එතුමිය විතරක් නෙමෙයි අනෙකුත් මාධ්‍යවේදින් ගැනත් සැලකිල්ලට ගෙන ඒ අයට අපෙන් ලබා දෙන්නට පුලුවන් උපරිම දෙයක් තියෙනවානම් පෞද්ගලික මට්ටමෙන් හරි කමක් නැහැ මන්ත්‍රිවරුන්ගෙන් ඒ අය වෙනුවෙන් අපි සහයෝගයක් ලබා දෙමු කියන ඉල්ලීම කරනවා. ඒ ඉල්ලිම කරමින් නගරාධිපතිතුමනි අපි අදද හෙටද එහෙමත් නැත්නම් තව මාස දෙකකින්ද තුනකින්ද කෙසේ නමුත් මැතිවරණයකට මුහුණ දෙන්න අපිට සිදුවෙලා තියෙනවා. මැතිවරණ තියෙන කාල සිමාව වසරක් පැනලා දැන් අවුරුදු 2කටත් කිට්ටුවෙලා තියෙනවා. මම හිතන්නේ රටේ ජනාධිපතිතුමා මේකට සත්භාවයක් දක්වනවා.රටේ ජනාධිපතිතුමා මැතිවරණය මග හැරිමක් පෙන්වන්නේ නැහැ. අපි කනගාටුවෙනවා මේ නගර සභාව නියෝජනය කරන මන්ත්‍රිවරු එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රිවරු නායකතුමාගේ කිමට පිටින් මේ සභාවේ මැතිවරනයක් කල් දානවාද කියන ඉල්ලිමක් කරනවාද කියන එක මම මැතිවරණය පිළිබඳව කථාකරන්නේ නැහැ ඉදිරියට.

**<u>මහා නගර සභා මන්ත්‍රි - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, සේනක මන්ත්‍රිතුමා මෙ කියන කාරණය එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රිවරු එහෙම ඉල්ලිමක් කරනවාලු මැතිවරණය කල් දාන්න කියලා අපි මැතිවරණයට හය නැහැ.

(සභා සෝෂා)

**<u>මහා නගර සභා මන්ත්‍රි - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා</u>**

ගරු නගරාධිපතිතුමනි, මැතිවරණයට අපිට මුහුණ දෙන්න වෙනවා. නගරාධිපතිතුමනි මම පළාත් සභාවෙන් අයින් වෙලා පළාත් සභා කාල සිමාව තියෙද්දි ඉල්ලා අස්වෙලයි මේ නගර සභාවට ආවේ. මම අද වෙනකොට කනගාටුවෙනවා මේ නගර සභාවට පැමිණිම සම්බන්ධව. මම මේ නගර සභාවට එන්නේ ඉස්සෙල්ලා මෙතන ඉන්න පක්ෂ විපක්ෂ මන්ත්‍රිවරු අපිත් එක් සුහදශිලිව හිටියා. හැබැයි මෙතනට ආවාට පස්සේ මම මෙතන දැක්ක දේවල් නිසා සමහර දෙවල් දැකලා ඉස්සරහා වාඩිවෙලා නිශ්ශබ්දව හිටියා. හැබැයි නිශ්ශබ්දව ඉන්න කොට දිගින් දිගටම මේවා බලාගෙන හිටියා. හැබැයි මෙතන වාඩිකරලා ප්‍රතිප්‍රහාර එල්ල කරනකොට මම හිතුවා මෙතනින් එහාට වැටෙන්න තැනකුත් නැහැ මෙතනින් එහාට මම හරියාකාරව කටයුතු කරනවා කියලා. මම මේකේ අසාධාරනකම් දැක්කා. මේකේ වෙන යම් යම් දුෂණ කියා දැක්කා. මහා පරිමාණ දූෂණ ක්‍රියාවලියන් දැක්කා. ඒවෙනුවෙන් කථාකරන කොට මම මෙතන තව දෙයක් දැක්කා. තමුන්නාන්සේව ආරක්ෂාකරන්න වෙනම පිරිසක් ඉන්නවා. හරි වැරැද්ද තව පිරිසක් බලාගෙන ඉන්නවා. මේ අය මොනවාද වෙන්නෙ කියන එක. හැබැයි ඒ පිරිස අතරේ මම දැක්කා මම කණගාටුවෙනවා හරිදේ දකින්නේ නැත්තේ ඇයි කියලා. මම මේ සභාවට ඇවිල්ලා මම මේ සභාවේ වැදගත් විදියට හිටියා වැදගත් විදියට කථාකලා. එක දවසක මට ඒක පාලනය කරගන්න බැරිව ගියා. මම මේ නගර සභාවේ යම්කිසි දේපලක් අයථාලෙස හදලා වික්කා කියපු එක මට ඉවසන්න බැරිව ගියා. මොකද මම එහෙම කරන පුද්ගලයෙක් නෙමෙයි. මම කුඩා කාලේ ඉදලා අපේ අම්මලා තාත්තලාගේ පුරුදු නිසා වෙන්න පුලුවන් කවදාවත් සත පහක දෙයක් මම අරගෙන නැහැ. දරුවන් එක්දහස්ගානක් ඉස්කෝලේට දාලා තියෙනවා සත පහක තේ එකක් මම බිලා නැහැ.මම මෙහෙම කටයුතු කලේ අනුරසිරි මන්ත්‍රිතුමාගේ දරුවත් මම දාලා දුන්නා මගේ වාහනයේ එක්කරගෙන ගිහිල්ලා. අපි එහෙමයි වැඩ කලේ. ඉතින් එහෙම වෙනකොට නගරාධිපතිතුමනි අපේ චරිතයක් හදාගෙන ඉන්නකොට ඒ චරිතය එක රැයින් විනාශකරනකොට අවුරුදු විස්සක තිහක විතර, ඉතින් නගරාධිපතිතුමනි මම කියන්නේ අපි එහෙම නොකැලැල් චරිතයක් ආරක්ෂා කරගෙන මෙතනට ඇවිල්ලා යම් යම් ප්‍රශ්න තියෙද්දි බාධක තියෙද්දි ප්‍රශ්න කොච්චර තිබ්බත් ඒවා යටපත් කරගෙන ප්‍රතිපත්ති ආරක්ෂාකරගෙන ඉදලයි මන්ත්‍රි කෙනෙක්

විදියට මෙතනට ආවේ. ඇවිල්ලා කටයුතු කරන කොට යම්කිසි චෝදනාවක් එල්ලවෙනකොට ඒ චෝදනාව දරාගන්න බැරිව කැගැහුවා. අනුර මන්ත්‍රීතුමා කිව්වා සේනක මල්ලි එදා පොඩ්ඩක් සැර වැඩි කියලා. නමුත් මම බලාගෙන හිටියා මේ තිරණය නිවැරදි වෙයිද? ඊලග සභාවෙදි ඉවරවෙයිද කියලා බලාගෙන හිටියා. නිවැරදිවුනේ නැහැ. මම නගර සභාවෙන් ඉල්ලුවා තොරතුරු දැනගැනිම් පනත යටතේ විස්තරයක්. ඒ තොරතුරු දැනගැනිම් පනත යටතේ මට නිසි පිළිතුරු ලැබුණා. මේ ඉඩම නගරසභාවේ ඉඩමක් නෙමෙයි කියලා. ඒනිසා මම තිරණය කලා සමහර මන්ත්‍රීවරු ගිහිල්ලා තැන් තැන්වල කියන්න ගත්තා සේනක මන්ත්‍රීතුමා දන්නේ නැද්ද අර ඉඩම හදලා තියෙනවා මම බැලුවා මේක දිගින් දිගටම වෙනවා මෙහෙම වුනොත් මගේ චරිතයට හානියක් වෙනවා. ඒනිසා නගරාධිපතිතුමනි මට මේකට නිතිමය ක්‍රියාවලියට යන්න ඕනවුනා. නිතිමය ක්‍රියාවලියට ගිහිල්ලා මම 4283-2022 ඩි ඒම් එන් ආර් යටතේ රු මිලියන 100ක් ඉල්ලලා වන්දියක් දාලා මොරටුව උසාවියේ නඩුවක් දාලා තියෙනවා.මම හිතන්නේ දේශපාලඥයෙක් විදියට කවදාවක් නගර සභාවක මන්ත්‍රීවරයෙක්ගෙන් මේ මොරටුව නගරසභාවේ මන්ත්‍රීවරයෙක්ගෙන් එහෙම වන්දියක් ඉල්ලා කවුරුවත් නඩුවක් දාලා නැතිව ඇති. මම එක නොදැම්මානම් සාධාරණව වැඩ කරන මන්ත්‍රීවරයෙක්ට අසාධාරණයක් වෙනවා. ඉදිරියේදි හරි යම්කිසි මන්ත්‍රීවරයෙක්ට චෝදනාවක් එල්ල කරනවානම් ඒ චෝදනාව දෙපාරක් හිතලා බලලා අපි ප්‍රතිපත්තිමය වශයෙන් ගැටෙමු. ඕනම දෙයකට තර්ක විතර්ක කරගමු. හැබැයි පෞද්ගලික ජිවිතයට දැඩි හානියක් වෙන ෆේස් බුක්වල ගැහුවා ලොකුවට.දැඩි හානියක්වෙන දෙයක් වෙනවානම් ඒකට පියවරක් නොගෙන නිශ්ශබ්දව ඉන්න මට බැහැ.මම මේක මුලික අඩි තාලම දාලා පෙන්නුවා. ඉදිරියේදි අනෙක් මන්ත්‍රීවරු ප්‍රවේශම් වෙලා ඒ කටයුතු කරන්න කියන ඉල්ලිම කරනවා. අනෙක් පැත්තෙන් සංතෝෂවෙනවා මම මෙතනට ආවාම මේකේ දැක්ක දෙවල් සම්බන්ධව. මේ දැක්ක දූෂිත ක්‍රියා සම්බන්ධව,මේ දැක්ක ජාතික අපරාධයන් සම්බන්ධව අන්න එකට විරුද්ධව කථාකරන්න නැගිසිටින්න පුලුවන් වුන එක ගැන මම හදවතින්ම සංතෝෂවෙනවා. නගරාධිපතිතුමනි තමුන්නාන්සේ මේ නගර සභාවේ සමහර අය කියයි අපි කම්වු රැස්විම් වලට ඒන්නේ නැහැ. ඔව් අපි එන්නේ නැහැ. අපි ඇවිල්ලා අතඉස්සුවාට වැඩක්වෙන්නේ නැහැ. යෝජනා දැම්මාට වැඩක්වෙන්නේ නැහැ. ඊට ඉස්සේල්ලා තමුන්නාන්සේ තමුන්නාන්සේගේ අභිමතය පරිදි ඒ ගෙවිම් කරලා ඉවරයි. එදා තමුන්නාන්සේ ලක්ෂ 44ක් ගෙවනවා මේ මුද්දර ප්‍රශ්නේ සම්බන්ධව නඩු කියන්න නිතිඥ මහත්තයෙක්ට නිතිඥ මහත්මයා පිළිබදව අපිට තර්කයක් නැහැ දක්ෂ නිතිඥ මහත්මයෙක්, ගාන පිළිබද ප්‍රශ්නකයකුත් නැහැ. අපිට ප්‍රශ්නය තියෙන්නේ අපි තනිව සටන් කරන්න ඕනේද මේකට මේ මුලු නගර සභාවල්වලට බලපාන ප්‍රශ්නයක්. තමුන්නාන්සේ මහානගර සභා සංසදයේ සභාපති තමුන්නාන්සේ නගර සභාව පැත්තකින් තියලා සියලු මහා නගර සභා එකරාශිවුනානම් සමහර විට මේ මුදල ලක්ෂ 44 නෙමෙයි යන්නේ එක ලක්ෂයකින් දෙකකින් අපිට බේරෙන්න තිබුණා. අපි මේ කරන්නේ මොරටු ජනතාවගේ බෙල්ලට තියල හිරකරලා ගන්න බදුවල තනියම වියදම් කරනවා අපිට රිසිසේ. මේක වැරදියි. මේවා වැරදි කියන්න බැරි ඇයි මන්ත්‍රීවරුනි මේවා අපි නවත්තගන්නට ඕනේ.ඇයි අපි මොරටුවේ ජනතාව අපිට දෙන බදුමුදල් සංවර්ධනයට යොදන්න පුලුවන්කම තියෙද්දි අපි තනිකරම මේක දාගන්නේ. තමන්නාන්සේලා මන්ත්‍රීවරු තමුන්නාන්සේලා නොහිතුවාට මෙතුමා හිතන දෙයක් ඇති මේකේ සම්පුර්ණ ක්‍රෙඩිට් එක මම ගන්නවා තවත් දෙයක් තියෙනවා මෙතුමා හිතනවා ඇති මෙතුමාට තියෙන නඩුවල හැටියට මම හොද නිතිඥ මහත්මයෙක් අල්ලලා ගත්තාම ඊලග නඩුවටත් මේ නිතිඥ මහත්මයාව ගන්න පුලුවන්ද කියලා. ඒක මම දන්නේ නැහැ ඒක මම හිතන විදිය ඒත් නගරාධිපතිතුමනි හිතන්න මොරටුව ගැන මොරටුව ජනතාව ගැන හිතන්න එහෙම හිතනවානම් තමුන්නාන්සේ කවදාවත් ලක්ෂ44 අරගෙන වියදම් කරන්න යන්නේ නැහැ. ඒවගේම පහුගිය කාලේ ලක්ෂ 27ක් ගත්තා මහ ඇමතිතුමා තමුන්නාන්සේට දාපු නඩු වලට නගර සභාවෙන් මුදල ගත්තා. මට ආරංචි විදියට ඒම් ඕ එච්ගේ නඩුවට මොරටුව නනගරසභාවෙන් ගෙවන්නේ කියලා. කොමසාරිස්තුමනි නිලධාරින් විදියට තමුන්නාන්සේලාත් මේවාට වගකියන්න වෙයි. අපි මේවාට යනවා ඉදිරියට අපි නවතින්නේ නැහැ.අපි මේවාට යනවා ඉදිරියට ගිහින් ඒ තැන් වලට ගෙනවා. අතඋස්සපු මන්ත්‍රීවරුන්ට මේවාට ගෙවන්න වෙයි කවදාහරි දවසක. හැමදාම මෙතන රැදෙන්නේ නැහැ. නගරාධිපතිතුමනි තමුන්නාන්සේ හැමදාම මෙතන රැදුනේ විධායක බලයක් පාවිච්චිකලේ තමුන්නාන්සේගේ අභිමතය පරිදි පාවිච්චි කරේ. මම කියන්නේ නැහැ නිහාල් නෙල්සන් මහත්තයාට එදා ඒ කරපු දේ අපි කරන්නට ඕනේ.එතුමා ඒතරම් දක්ෂයෙක් මොරටුවේ කලාකාරයෙක් විදියට

තමුන්නාන්සේ අවමංගල්‍ය සභාවේ කිව්වා අපි සභා තිරණයක් අරගෙන තියෙනවා මේක නොදී ඉන්න. හැබැයි මම තමුන්නාන්සේට ප්‍රශ්නයක් ඉදිරිපත් කරා. මම ඒ ප්‍රශ්නය ඇහුවාම ලුනාව කලපුව ඒ ක්‍රිඩාංගනයේ අපි පූජ්‍ය පක්ෂය සඳහා පමණක් වෙන් කරලා තියෙනවාද කියලා යෝජනාවකින් මම ලේකම්තුමාගෙන් තොරතුරු දැනගැනිමේ පනත යටතේ ඉල්ලුවා. හැබැයි එහෙම තියෙනවානම් දෙන්න පුලුවන්කම තියෙන්න ඕනේ. සති දෙකක් ගිහිල්ලත් එක දුන්නේ නැහැ.තව දවස් 21ක් ඉල්ලුවා. අපි ඉවසන් ඉන්නවා හරි තොරතුරු දැන ගැනිම් පනතේ කල් ගන්න පුලුවන්කම තියෙනවා. හැබැයි නොදී හිටියොත් අපි හිතන්නේ මොකක්ද මෙහෙම තිරණයක් අරගෙන නැහැ. මම ඇහුවා හිටපු අයගෙන් පැරණි අයගෙන් අහුවා ඔවුන් කිව්වා අපි අත උස්සලා නැහැ කියලා. හැබැයි නගරාධිපතිතුමනි එහෙම නම් තමුන්ගේ ඒ බලය පාවිච්චි කරලා ඒ දේ කරානම් ඉදිරියේදි තමුන්නාන්සේ විතරක් නෙමෙයිනේ ඔය පුටුවේ වාඩි වෙන්නේ. තමුන්නාන්සේ තව මාස දෙක තුනක් ඉදියි අපි දන්නවා කවුරුකිව්වාත් ඔය පුටුවට නැවත යන්න අමාරුයි. අපි හිතනවා යන්නේ නැහැ කියලා. මොරටුව ජනතාවගේ පිනට ඔතන තමුන්නාන්සේ නැතිව වෙන කෙනෙක් වාඩි වෙලා එතන දුන්නොත් තව කෙනෙක්ට කරන්න අපි කියන්නේ නැහැ කලාකාරයො ඉහල කෙනෙක් ඇවිල්ලා අවමංගල්‍ය කරන්න දුන්නොත් අපි කරන්නේ නිහාල් නෙල්සන් කලා කරුවාට කරන අගෞරවයක් එතුමාට දුන්නේ නැහැ එදා. රාවතාවත්තේ ඉදලා අරගෙන ගියා සොයිසාපුරට. ලොකුවෙලාවක් ගියා සොයිසාපුර අරගෙන ගිහිල්ලා ඒ උත්සව සභාව හරියාකාරව සංවිධානයවුනේ නැහැ. කථා විසිගානක් තිබ්බා. මරණය විතකයට දානකොට හවස 6.45 කලුවරට දාන්න වුනේ නිසි ගෞරවයක් එතන ලැබුනේ නැහැ. උත්සව සභාවේ මේ කලපුව දුන්නානම් රාවතාවත්ත එතුමාගේ ගමේ බොහෝම ලගින් යන්න තිබ්බ තැනක්. ගිහිල්ලා මේ දේ කරන්න තිබ්බා. උත්සව සභාවේ කටයුතු ටික කලා සංවිධානය හරි නැතිවුනාට. නමුත් මෙතන කරානම් ඔක්කොන්ටම වඩා සංතෝෂවෙන්න තිබ්බා අපිට. ඒනිසා මේවා ගැන තමුන්නාන්සේගේ ඔය බලය ඔය විදියටම පාවිච්චිකරන්න යන්න එපා. මොකද ඒකෙන් පෙන්නේ තමුන්නාන්සේ අවුරුදු 15ක් දිර්ඝ කාලයක් හිටියාම නැති බලයක් ආරුඪ කරගන්න බලනවා. ඒනිසා ජනතාවට තේරුන වෙලාවට අවුරුද 15කින් ඇති කියලා තේරුන වෙලාවට ජනතාව ඒ තින්දුව ගනි කියන විශ්වාසය අපිට තියෙනවා. ඒනිසා මම තොරතුරු දැනගැනිම් පනත යටතේ ඉල්ලිම් කරලා තියෙන තොරතුරු ගණනාවක් තියෙනවා. මම ඉල්ලුවා අර ලුනාව කලපුවේ පර්චස් තුනකුත් ඒ ප්‍රමාණය සම්බන්ධයෙන් අවසාන ප්‍රශ්න කිහිපයට මට පිලිතුරු ලැබුන්නැහැ.නාගරික කොමසාරිස්තුමනි මම ගාව තියෙනවා ලේකම්තුමනි මම ගාව තියෙනවා එකේ එවනවා කිව්ව එක අටවෙනි මාසේ තාම එවලා තිබ්බේ නැහැ.ඒනිසා තොරතුරු දැනගැනිම් පනත යටතේ අපි ඉල්ලපු තොරතුරු අපිට ලබා දෙන්න. මොකද ඔතන ඉදලා මෙතනට වාඩි වෙනකොට මම හොද ආයුධයක් අරගෙන ආවේ. මට හොද ශක්ති සම්පන්න ආයුධයක් තිබ්බා. ඒක කඩුවක්වත්,පිස්තෝලයක්වත් නෙමෙයි තොරතුරු දැනගැනිම් පනත මේක ඇති හැමෝටම ගහන්න. මේක ඇති කරකවලා ගහන්න. මේක ඇති වට්ටලා දාන්න. ඒනිසා මෙතුමා මේ දවස් ටිකේ හරි උනන්දුවෙනවා ඇවිදින මන්ත්‍රිරු අසල කොහොමද ගෙඩනැගිලි සිමා තියන්නේ කියලා. බොහොම උනන්දුවක් තියෙනවා මෙතුමාට. මම දැක්කා නාගරික සංවර්ධන අධිකාරියට තැන් තැන් වලට අහනවා. ඒ උනන්දුව එතන තියෙනකොට හැබැයි අර පොල් කෙන්දක්වත් නැති කෙනා පොල් ගහක් තියාගෙන හොයන කෙනාගෙයි ප්‍රශ්නයක් තියෙනවා. මම ඊට පස්සේ ලියුමක් දැම්මා විල්ලෝරවත්තේ ප්‍රධාන පාරේ ඉදලා ගොඩනැගිලි සිමාවට කොච්චරක් තියන්න ඕනේද? එතකොට දිලා තිබ්බා අඩි 25ක් තියන්න ඕනේ කියලා තමුන්නාන්සේට මතකයි තමුන්නාන්සේට දැම්මා ආණ්ඩුකාරවරයා ලියුමක් එවලා තියෙනවා ඒවගේම පළාත් පාලන කොමසාරිස්වරයා ලියුමක් එවලා තියෙනවා තමුන්නාන්සේගේ පුතාගේ බිල්ඩින් එක ගැන. මේක අනවසරයි කියලා. හැබැයි එතනදි මට ප්‍රශ්නයක් තියෙනවා මෙතන කාර්මික නිලධාරියා වාර්තා කරනවා මේ ප්‍රමාණය හරි කියලා. අපි ඉන්නේ එතැන. කාර්මික නිලධාරියා කොහොමද එහෙමනම් ආණ්ඩුකාරවරයාට බොරුකරන්නේ. ආණ්ඩුකාරවරයාගේ,පළාත් පාලන කොමසාරිස්වරයාගේ ඇස් වැහුව කාර්මික නිලධාරියා කවුද? මට ආරංචියි ඒ කොට්ඨාශයේ එක්කෙනා නෙමෙයි වෙන කෙනෙක්ට කියලා මේ වාර්තාවල් දාලා තියෙනවා කියලා. එගොල්ලෝත් පරිස්සම් වෙන්නවෙයි. තර්ජනයක් නෙමෙයි නිතියට පිටින් වැඩ කරනවානම් ඒ නිතියට අපි සූදානම්. ඒ අයව එතනට ගෙනියන්න. ඒනිසා මේක නගරාධිපතිවරා අපි දන්නවා පහුගිය කාලේ එතුමා මම මෙතන පහුගිය සභාවලම කැගැහුවා ඉදිරිපත් කරා හයියෙන් කැගැහුවාට හරවත් එවගේම වැදගත් යෝජනා ඉදිරිපත් කලේ මම.

හැබැයි මුලසුනෙන් බලාපොරොත්තු වුනේ උත්තර. මුලසුනේ මට චෝදනාවක් විතරයි එල්ල කලේ. කවදාවත් ප්‍රශ්නවලට උත්තරයක් මට දුන්නේ නැහැ.අන්න ඒනිසා අපි කියනවා නගරාධිපතිවරයාට පුහගිය කාලේ රිමන්ඩ් එකේ ඉන්න වුනා. එයාට එයාව බේරගන්න බැරිව ගියා. පක්ෂ නායකයන්ට එයාව ආරක්ෂාකරගන්න බැරිව ගියා. ඒනිසා කොමසාරිස්තුමනි ලේකම්වරු ප්‍රමුඛ නිලධාරි මහත්වරුන්ගෙන් ඉල්ලා සිටින්නේ තමුන්නාන්සේ තමුන්නාන්සේගේ රැකියාව ගැන උනන්දුවෙන්න, විමසිලිමත් වෙන්න, ආරක්ෂා කරගන්න මොකද අපි පිටිපස්සෙන් ඉන්නවා ඕතන හෙට මම වෙන්න පුලුවන් මම අදහසක් තිබ්බේ නැහැ හැබැයි දැන් හිතෙනවා තිරණයක් ගත්තොත් ඕතන වාඩිවෙලාම තමයි නවතින්නේ. මම නොවෙන්න පුලුවන් තව කෙනෙක් වෙන්න පුලුවන්. හැබැයි ඕතන වාඩිවෙන කවුරුවුනත් අපිට දෙයක් කියලා කරගන්න පුලුවන් කම තියෙනවා. මොකද වරදක් නෙමෙයි අපි කියන්නේ. හරිදෙයක් කියන්නේ. වැරදි දෙයක් සම්බන්ධව පෙන්නලා දිලා මේ වැරැද්දට පරික්ෂණයක් තියන්න කිව්වාම එක නොකර ඉන්න බැහැ. එතනදි නිලධාරින් වෙන්න පුලුවන් අපි පිටිපස්සෙන් ඉන්නවා. ඒ සම්බන්ධව ඒ දෙවල් වෙන්න පුලුවන්. ඒනිසා නගරාධිපතිතුමනි මම කියනවා මේක නිසා මේ මාස ගානවත් කල්පනාකාරිව වැඩ කරලා තමුන්නාන්සේගේ බලය විධායකයක් විදියට පාවිච්චිකරලා කරන්න හොද දෙවල් කරන්න. සංවර්ධන දේවල් අපි අත්දෙකම උස්සනවා. නමුත් අසාධාරණ විදියට කටයුතු කරනවානම් අපි එකට විරුද්ධව නැගි සිටිනවා.

**03(16)** **<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, එක්සත් ජාතික පක්ෂයේ උණුසුම් සුභපැතුම් එක්කරනවා අපේ රේඛා තරංගනි මාධ්‍යවේදිනියට. ඒවගේම තමයි මම කියන්න කැමතියි කටුබැද්ද වෙළද සංකිර්ණය ගැන කටුබැද්ද වෙළද සංකිර්ණයේ ව්‍යාපාරිකයින් සියලුදෙනාටම වගේ කඩ කාමර වෙන්වි තිබෙනවා. ඒවගේම කොල මිටි විකුණන අම්මා ගැනත් ඒවගේම කිරි කොස් විකුණන අම්මා ගැනත් සැලකිල්ලට අරගෙන එගොල්ලන්ටත් අවස්ථාවක් ලබා දිලා තියෙනවා. කණගාටුවට කරුණක් තමයි හරක්මස් විකුණන ව්‍යාපාරිකයාටත් මාලු විකුණන ව්‍යාපාරිකයාටත් එතන අවස්ථාව අහිමි වෙලා තියෙනවා. ඉතින් ඒ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමුකරන්න කැමතියි. මොකද මොරටුවේ ජනතාව 177000ක් ඉන්නවා. එකෙන් 5000ක් පමණ තමයි මුස්ලිම් ජනතාව ඉන්නේ. එතන බැලුවාම හරක් මස් කඩ මොරටුව තුල මම හිතන්නේ 7ක් පමණ තියෙනවා. එතනින් පෙනවා කවුද වැඩිපුර පරිභෝජනය කරන්නේ කියලා. ඒනිසා මම කියනවා මේ දේපල ගැනත් මේ ව්‍යාපාරිකයින් දෙදෙනා ගැනත් අවධානය යොමු කරලා එතුමන්ලාගේ ආර්ථික තත්ත්වය කඩා වැටෙන්න අරින්නේ නැතිව එගොල්ලන්ටත් අවස්ථාව දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**03(17)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,විශේෂයෙන් ගිය සභාවාර කිහිපක් තුලදිම කඩලානේ තියෙන ප්‍රශ්න ගනනාවක්ම ඉදිරිපත් කරා සභාව හමුවේ. ඒ කිසිදු ප්‍රශ්නයකට පිළිතුරක් ලැබුනේ නැහැ කියන එක ප්‍රධාන වශයෙන් කියා සිටිනවා. ඒ සම්බන්ධව අපේ මැක්සි මන්ත්‍රිතුමත් එතුමාගේ නෝනාගේ තාත්තාගේ ගේ ඉදිරිපිට පවතින වල හිමික්ස් යොදලා හදන්න කියලා කිව්වා. විශේෂ සුභාශිංෂනයක් පුදකරනවා අපේ රේඛා තරංගනි ජෙෂ්ඨ පුවත්පත් කලාවේදිනියට ඒ ලබපු ජයග්‍රහණය සහ එතුමියගේ ඉදිරි අනාගත වැඩ කටයුතු සියල්ල සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා කියා ප්‍රාර්ථනා කරනවා. ඒවගේම වසර 180කට පසු පුවක්අරඹ මෙතෝදිස්ත විදුහලට අපේ නායක හිටපු අමාත්‍ය වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රී ඉරාන් වික්‍රමරත්න මැතිතුමාගේ ඉල්ලිමක් හැටියට සහ සේනක දමයන්ත අපේ පළාත්සභා මන්ත්‍රිතුමා හිටපු එතුමාගේ සහයෝගයෙන් ලබාදුන්නු බස් රථය සම්බන්ධව අපේ ගරු විපක්ෂ නායක සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාට අපේ ස්තුතිය මේ අවස්ථාවේදි පිරි නමනවා.

**03(18)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි,සුභ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරනවා 2023 වසරේ පලවෙනි සභාව වෙනුවෙන් ජනතාව වෙනුවෙන් කිසියම් ආමන්ත්‍රණයක් කිරිමට බලාපොරොත්තු වෙනවා. ප්‍රථමයෙන්ම රේඛා තරංගනි මහත්මියට මමත් සුභ පතනවා කාන්තාවක් විදියට. කාන්තාවන් යම්

යම් ඉලක්ක ජයග්‍රහණ අත්කර ගන්න ලොකු කැපකිරීම් කරලා තමයි ඒ තැන්වලට එන්නේ. ඉතින් ඒ සම්බන්ධයෙන් එතුමියට සුභ පතනවා. ඒවගේම විශේෂයෙන්ම පහුගිය දවස්වල ජනතා ප්‍රශ්නවලදී මම දැක්කා කාණු පද්ධතිය පිරිසිදු කිරීම් සම්බන්ධයෙන් කිසියම් වැඩ පිළිවෙලක් තිබ්බා. ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒත් එක්කම විශේෂයෙන්ම මොරටුමුල්ල ප්‍රදේශයේ කානු පද්ධති සුද්ධකරලා ඒ ඇතුලේ තිබ්බ පස් ඉවත් කරලාම ඒ කාණු පද්ධතිය උඩින් තබපු අවස්ථා ගොඩක් තිබ්බා. ගරු නගරාධිපතිතුමනි ඒවා ඉවත් නොකිරීම මත ඒ ජනතාව සමහරක් වෙලාවට ඒවා තමන්ගේ වතු වලට ඇදගෙනම ස්ථාන පවිත්‍රකරපු අවස්ථා තිබ්බා. ඉතින් එම අවස්ථාව මට කියන්න ඕන කරන්නේ එම පස් නැවත වර්ෂාවත් එක්කම නැවත එම කානුව ඇතුලටම තැන්පත්වීමක් තමයි සිද්ධවෙන්නේ. ඒනිසා එතනදි එම කටයුත්ත විශේෂ අවධානයක් යොමුකරන්න. පස් ඉවත්කිරීමෙන් පසු නැවත එම පස් එම ස්ථානයේ තැබීමෙන් වලකින්න කියන ඉල්ලීම කරන්න කැමතියි. ඒත් ඒකකම විශේෂයෙන්ම ප්‍රධාන කාර්යයක් ලෙස අධ්‍යාපනය අඩාලවෙලා තියෙන වෙලාවක මම හිතන්නේ ළමයින්ට පොත් කට්ටලය ලබාගත නොහැකි තත්ත්වයක් තියෙනවා. අත්‍යාවශ ලිපි ද්‍රව්‍ය සහ පොත් පත්වල මිල හිතාගත නොහැකි තරම් මිල වර්ධනයක් වීම නිසා පාසල් දරුවන්ට අවශ්‍ය මම හිතන්නේ අපි ලබාදෙන පොත් කට්ටලය ඔබතුමා නගර සභාව හරහා ලබාදෙන පොත් කට්ටලය හැකි ඉක්මනින් අපි වෙත ලැබුනොත් ඒක ඉතාම යහපත් ක්‍රියාවක් ලෙස මම අගයනවා. මොකද මේ වෙලාවේ රටම අස්ථාවර වෙලා ඉන්න වෙලාවේ අධ්‍යාපනය කඩා වැටීමට ඉඩනොදී මොරටුවේ දරුවන්ට නගර සභාව තුලින් කරන්න පුලුවන් කාර්යය ඉටු කිරීම තමයි අපේ වගකීම. මහජන නියෝජිතයෝ විදියට කියන එක මම නැවතත් මතක් කරනවා. එත් එක්කම විශේෂයෙන්ම විදුලි බිල වර්ධනය වීම අපිට අනාගතයේ මුහුණ දෙන්න සිද්ධවුනොත් මොරටුවේ දැවැන්ත ප්‍රශ්නයක් බවට වඩු කර්මාන්තය නැවත ජනතාව දැන් අපිත් එක්ක කථා කරනවා වඩු කර්මාන්තය දැනටත් සම්පූරණයෙන් අඩාලවෙලා තියෙන වෙලාවක නැවත නැවතත් විදුලි බිල වර්ධනය වුනෝතින් වඩුවාට අවශ්‍ය අත්‍යාවශය සියලු කාරණා සඳහා මිල වැඩි වීමක් සිද්ධවෙනවා. අපි දන්නවා ඉරුම් කුලියේ ඉඳන් ප්‍රවාහන ගාස්තු පවා සියල්ලක් වැඩිවෙලා හාඩ්වෙයා අයිටම් කොහොමත් 36000 තිබ්බ ටිනර් එක 160000ට ගිහිල්ලා ඉතාම වැඩිවීමක් සිද්ධවෙලා තියෙනවා. මම හිතනව මෙතන ඉන්න 48 දෙනාගේම වගකීම මොරටුවේ දැවැන්ත ප්‍රශ්නය අපේ ප්‍රධාන ජීවනෝපාය තත්වය ආදිකාලේ ඉඳන් අපේ මුතුන්මිත්තන් කරපු කාර්යය රැකගැනීම. මම හිතනව ඔබතුමාගෙත් වගකීමක් විදියට මම දකිනවා මම ඉතාම ගෞරවයෙන් නැවත නැවතත් මතක් කරනවා විදුලි බිල්පත් සමග මෙය වැඩිවුනොතින් වඩුවන්ට දරාගතනොහැකි තත්වයක් ලඟදීම උද්ගතවෙනවා නගරාධිපතිතුමනි කර්මාන්තය වැහුනොත් අපි ජීවත්වෙලා හමාරයි. අපේ මිනිස්සුන්ට කන්න බොන්න නැතිව මියැදෙන තත්වයක් ඇතිකරන්න එපා. කරුණාකරලා මේ දැවැන්ත ප්‍රශ්නයට අපි උරදෙමු කියන ඉල්ලීම කරනවා. අපි හැමෝම එකතුවෙලා විශේෂයෙන්ම කමිටුවක් රැස්කරලා හරි වඩුවන් ආරක්ෂාකර ගැනීමේ වැඩ පිළිවෙලක් හදමු.මමත් අදටත් ජීවත්වෙන්නේ වඩු කර්මාන්තය නිසා.අපි දන්න හැමෝම අපිත් එක්ක ඉන්න හැමෝම ජීවත්වෙන්නේ වඩු කර්මාන්තය නිසා. කරුණාකරලා ඒ පිළිබඳව ඔබතුමා දැඩි අවධානය යොමුකරන්න කියන ඉල්ලීම කරනවා. එත් එක්කම තිසර මන්ත්‍රීතුමා කිව්වා වගේම අධ්‍යාපනය පැත්ත ගැන හිතද්දී මම හිතන්නේ ලංකාවේ ප්‍රධාන විපක්ෂය විදියට සමගි ජන බලවේගය කියන පක්ෂය ගරු නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා මොරටුමුල්ල කොට්ඨාශයට අපේ මෙතෝදිස්ත උසස් විදුහලට ලබා දුන්නු රුපියල් පනස්ලක්ෂයක් වටිනා බස් රථයක් මම හිතනවා ගරු නගරාධිපතිතුමනි බලය තුල සිටියේ නැතත් බලය රහිතව හිටියත් අපිට හැමෝටම පුලුවන් රටට සේවයක් කරන්න.එතුමා ආදර්ශයක් ගෙනත් දුන්නා. ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාගේ සහයෝගය එතුමාට ලබා දෙන්නත් බස්රථය මොරටු මුල්ලට මගේ කොට්ඨාශයට සේනක මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයට ලබා දීම අපි ලබපු ගෞරවයක්. මේ අවසන් කාලය අපි ගත කරන්නේ මම හිතන්නේ සභා වාර දෙකක් හෝ තුනක් හෝ කිහිපයක් තමයි තියෙන්නේ. ඉතින් ඔබතුමා අපි කුලල් කාගත්ත යුගය අවසන් කරලා හැමෝම එකට එකතුවෙලා පුලුවන්නම් මේ අවසාන කාලය හරි එකිනෙකා අතර සහයෝගය වර්ධනය කරලා නගරයක් විදියට මොරටුව වෙනස් කරන්න පුලුවන් දේවල් පරණ කෝන්තර මාන්තර ඔක්කෝම අමතක කරලා රටක් විදියට ඉස්සරහාට යන්න පුලුවන් පරිපාලන ව්‍යුහයක් නිර්මාණය කරමින් විශේෂයෙන්ම මොරටුව අලුත් මොරටුවක් නිර්මානය කරන්න 2023 වර්ෂයේ අපිට හැකිවේවා කියා ප්‍රාර්ථනා කරනවා. විශේෂයෙන්ම වඩුවන්වෙනුවෙන් කටයුතු කරමු කියන ඉල්ලීම මම නැවත නැවතත් මතක් කරනවා.

**03(19)මහා නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා**

ගරු නගරාධිපතිතුමනි,සජිත් ප්‍රේමදාස මැතිතුමන් දුන්නු බස් රථය ගැන ස්තුතිවන්ත වෙනවා. මම කණගාටුවෙනවා හේතුව තමයි ඉරාන් වික්‍රමරත්න මැතිතුමාව මොරටුවට හඳුන්වලා දුන්නු පුද්ගලයා වශයෙන් 2012 ඔය ඉස්කෝලේට තමයි මම ගෙනාවේ. මොකද එදා මම සභාවට ගෙන්නලා මම ගැන කිසිම කෙනෙක් දන්නේ නැතිවිදියට කථාකරා. හේතුව මම තමයි මොරටුවේ දැනට යුඑන්පි එකේ ඉන්න පරිනතම දේශපාලඥයා ඒවගේම ප්‍රධානම මන්ත්‍රිවරයා 2001 වර්ෂයේ සිට අඛන්ඩව ඉන්නවා. එම බස්එක ගෙන්න ප්‍රධානියා වුනේ මම 2018. එතකොට කවුරුවත් මන්ත්‍රිවරු හිටියේ නැහැ. අපේ ඉස්කෝලේ තිලකසිරි මන්ත්‍රීතුමා ක්‍රිෂාන්ත විජේරත්න මන්ත්‍රීතුමා,ලලිත් මන්ත්‍රීතුමා,මෝරිස් විජේරත්න මැතිතුමා ඉන්නවා. මම තමයි එම ඉස්කෝලේ වසර 7ක් ආදි ශිෂ්‍ය සංගමයේ උපසභාපති. සජිත් ප්‍රේමදාස මහත්මයාටත් දන්වන්න කථාකරන්න ඕනේ. අපි පත්තර වාර්තාකරන මහත්ම මහත්මීන් ඉන්නවා. ඒනිසා එතුමාටත් දන්වන්න. එතුමත් ඇවිල්ලා එය අනෙක් මන්ත්‍රිවරු සේරගේම නම් කිව්වා. මම තමයි උප සභාපති 2018 මම තමයි ඉරාන් මහත්තයාට කියලා ඉල්ලීම කරේ. ඒක එතුමා කිව්වා. ඒනිසා ඒකේදි මම ඉල්ලීමක් කරනවා ස්තුතිවන්ත වෙනවා අපේ ඉස්කෝලේට යමක් ලැබීම පිළිබඳව. කණගාටුවෙනවා ඒදින ඔය දේට අතගහපු ඔය කියන මැතිතුමාව ගෙන්වපු පුද්ගලයාව ආදිශිෂ්‍ය සංගමයේ උපසභාපතිවරයාව අමතකවීම පිළිබඳව කණගාටුවෙනවා.අපේ ඉස්කෝලේ ආදිශිෂ්‍යයෝ ගොඩාක් ඉන්නවා. ඒනිසා ඒ පිළිබඳව මතක් කරනවා.

**ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, විශේෂයෙන්ම මම ආයතන හා පෙත්සම් පැමිණිලි යටතේ පිළිතුරු ලබා දීමට යන්නේ නැහැ. විශේෂයෙන් මා උදෙසා මගේ දරුවන් උදෙසා අහන ප්‍රශ්න වලට මම උත්තර දෙන්න මට පුළුවන් කමක් නැහැ ඒක ආදාළ වන්නා වූ අධිකරණයකදී හෝ කුමන හෝ අවස්ථාවක උත්තර සපයා ගන්න පුළුවන්.

සිත්ති මසීනා බක්කර් මන්ත්‍රීතුමිය කිවුවා දිනපොලේ තිබෙන වෙළඳාම් සම්බන්ධව එහි නිර්මාණයත් එක්ක වෙළඳාම් කිරීමේ කටයුත්තට ශීත කළ මස්, ශීත කළ මාළු පමණක් සිදුකිරීම සඳහා වන්නාවූ සැළැස්මකුත් අනුමැතියක් එක්ක තමයි එය හදලා තිබෙන්නේ. මා ඔබතුමියටත් ඔවුන්ගේ ඉදිරියේදීම කිවුවා වෙන තැනක් බලන්නම් මොකද මට පුළුවන් කමක් නැහැ එතන නැති එකක් දීලා බොහොම අංග සම්පූර්ණ එකකට සුපර් මාකට් එකේම සියළු දෙනාට අහිතකර වෙන ආකාරයේ දෙයක් කරන්න මට බැහැ. මොකද මම දන්නා තරමින්ම වසර 45ක් 50ක් මාළු විකුණපු කෙනෙකුත්. එතනින් අයින් වෙන්න සිද්ධවුනා එ නිසා මම ඔබතුමියට ආසාධාරණයක් කරන්නේ නැතුව ඒ කටයුතු බලනවා.

ඒ වගේම විශේෂයෙන් අපි මේ සුබපැතුම නොකලොත් එය හොඳ මදී කියලා මම හිතනවා. මේ පණිවිඩය මට කතා කරලා රේඛා තරංගනී මහත්මිය කියනකොට මට මෙහෙම සම්මානයක් ලැබුණා කියලා, එතුමිය මට කතාවක් කිවුවා මට වැදගත් ඒ කතාව එතුමිය කිවුවා මට මේ සම්මානය ලබා ගැනීම සඳහා ඔබේ මහා නගර සභාවෙන් කරන්නාවූ පරිසර හිතකාමී වැඩ මම වැඩි කොටසක් ලිවුවේ, මොරටුව නගර සභාවේ පරිසර හිතකාමී වැඩසටහන් මම ලියපු නිසා මම මේ ඇගයීමට පාත්‍රවුනා කියලා. ඒ වචන ටික ඇහුවාම මම ඉතාමත් සතුටට පත්වුනා. මොකද සම්මානයට පත්‍රවීමට හේතුව මොරටුව මහා නගර සභාව වීම. ප්‍රශංසනීයයි ඔබතුමියගේ කාර්යය භාර්යය ඔබතුමිය ඒ ලියන වැකි වල තියෙන්නා වූ දෙයින් සමාජය ගත්තාවූ පාඩමක්. ඒ නිසාමයි ඔබතුමියව අගය කරලා තියෙන්නේ, ඒ වෙනුවෙන් අපි ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. මොරටුව ලංකාදීප වාර්තාකාරණිය හැටියට ඔබතුමියට අපි ප්‍රශාංසා කරනවා.

**04. ප්‍රශ්න -** නැත.

## 05. යෝජනා,

**<u>නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, 13 (ඌ) වගන්තිය යටතේ ඉදිරිපත් කර ඇති යෝජනාව සභාව හමුවේ තැබීමට අවසර දෙනවා.

05(01). නගරාධිපති ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු, මහා නගර සභා මන්ත්‍රී එච්. ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු, ජී. සුරංග එන් අපෝන්සු, එස්. කේසර රවින්ද්‍ර ප්‍රනාන්දු, බී. සජිත් දුමින්ද පීරිස්, යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා, එම්. චන්ද්‍රා ගාමිණී පීරිස් යන මහතුන් විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව නගරාධිපති ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

"මොරටුව පුරවරයේ උපත ලබා වසර හැත්තෑ හයක පමණ කාලයක් මොරටුව පුරවරයේ දිවිගෙවමින් ශ්‍රී ලාංකීය සංගීත කලාවට මහඟු මෙහෙයක් කළ දිවංගත සංගීතවේදී නිහාල් නෙල්සන් මහතාට මොරටුව මහා නගර සභාවේ ගෞරවනීය උපහාරය පුද කළ යුතුයැයි යෝජනා කරන්නීය"

මෙම යෝජනාව නියෝජ්‍ය නගරාධිපති ඩී.සමන්ත සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදි.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, වයස අවුරුදු 76ක් අපි සමඟ ආයු වින්දනය කරලා ශ්‍රී ලංකා ගීත කලාවට කරුණා සුවඳ තැවරූ අපේ ආදරණීය අසහාය ගායන ශිල්පියා නිහාල් නෙල්සන් මහත්මයා දැයෙන් සමුගෙන ටික දිනක් වෙනවා. සභාවක් විදිහටත් මොරටුවේ ජනතාව විදිහටත් මා ප්‍රථමකොට එතුමගේ ආදරණීය පුත් තරංග නෙල්සන් මහතා ඇතුළු පවුලේ සැමට මගේ පෞද්ගලික ශෝකයත් මොරටු ජනතාවගේ ශෝකයත් පුදකරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. නිහාල් නෙල්සන් මහතා පිළිබඳව අපේ හිතේ මේ රටේ බිහිවෙච්ච කලා කරුවෙක් විදිහට ගායන ශිල්පියෙක් විදිහට තියෙන ගෞරවය වගේමමොරටු පුත්‍රයෙක් විදිහටත් විශේෂයෙන්ම අපි අධ්‍යාපනය ලබපු මොරටු මහා විද්‍යාලයේ කීර්තිමත් ආදිශිෂ්‍යයෙක් විදිහටත් ඒ වගේම ඒ සියල්ල අභිබවමින් ඉතාම නිහතමානීව අපිත් සමඟ ඇසුරු කරපු ලෙන්ගතු කලා කරුවෙකු විදිහටත් ඔහු පිළිබඳව අපිට විශාල ගෞරවයක් තිබෙනවා. ගරු නගරාධිපතිතුමනි, එතුමන් ගායන ශිල්පියෙක් වගේම ගීත රචකයෙක්, ගී තනු නිර්මාපකයෙක් එ වගේම ලංකාවේ ප්‍රසංග වේදිකාවේ පෙරලිකාරයා විදිහටත් වසර ගණනාවක් කටයුතු කළා. එතුමාගේ ජීවන චරිතය ගැන මතක් කරනකොට කියන්න ඕන අපි කලිනුත් අහලා තියෙනවා කෙනෙක් මැරෙන්නම ඕන ඉපදෙන්න කියලා. නිහාල් නෙල්සන් කියන්නේ මැරුන විට නැවත ඉපදුන ගායකයෙක් කියලා තමයි අපි විශ්වාස කරන්නේ. එතුමා වේදිකාවේ අමරණීයව ජීවත්වෙලා මියදුනේ, එතුමාගේ පළවෙනි ගීතය හෙළ කතාවට දායාද කරපු තැන ඉඳලා එතුමන් මරණයට පත්වෙන තුරුම එතුමන්ගේ ජනප්‍රියත්වය එකම තලයක පවත්වගත්තු ආදරණීය ගායන ශිල්පියෙක් හැටියට අපි දකිනවා. ක්ෂේත්‍රයට කොපමණ ගායන ශිල්පින් ආවාත් හතුපිපෙන්න වගේ නැති වෙලා යනවා. ඒ සියල්ලට නිහාල් අයියා අදර්ශයක් සැපයුවා. ගරු නගරාධිපතිතුමනි එතුමන් මූලික ආධ්‍යාපනය හැදෑරුවේ වර්තමානයේ රාවතාවත්ත රෝමානු කතෝලික පාසලේ එදා 8 වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරලා මොරටු මහා විද්‍යාලයේ 8 වසරේ සිට උසස් අධ්‍යාපනය දක්වා අධ්‍යාපනය හැදෑරුවා මොරටු මහා විද්‍යාලයේ වේදිකාව තොතැන්නක් කරගෙන පාසල් වේදිකාවෙන්, ගුවන් විදුලියෙන් රට හඳුනාගත්තු ඒ ආදරණීය ගායන ශිල්පියා එතනින් ආරම්භ කරපු ගමන ලංකාවේ වැඩිම ගීත ඇල්බම් ගණනක් ගීත ඇල්බම් 113 ක් කලාරසිකයින්ට ප්‍රදානය කරපු ආදරණීය ගායන ශිල්පියා බවට පත්වුනා. තමන්ගේ ගීත ශෛලිය වේග රිද්ම වුනත් ඒ වේග රිද්ම ශෛලියට උපකාර කර ගත්තු රචනාවන් එයින් කියවෙන බොහොම සුමට, සරල ආකාරයට ජනතාව වෙත අරන් ගිය බොහොම අවවාදාත්මක ගීත රාශියක් ජනතාව වෙත අරන් ගිය ගායන ශිල්පියෙක් ගරු නගරාධිපතිතුමනි. ඒ වගේම තමයි එතුමාගේ ගීත වල තිබිච්ච කරුණාව

දායාව එතුමාගේ හදවත තුළ තිබිච්ච බව අපි පෞද්ගලිකව දන්නවා. එතුමා මේ සමාජයට දෙන්න හදපු පණිවිඩය ගීත වලින් බෙදපු පණිවිඩය එතුමාගේ ජීවන චරිතය ඇතුලේ හදුනා ගන්න තිබුණා. අනෙක් කලා කරුවන්ටත් විශාල සහයෝගයක් ලබා දීපු කලා කරුවෙක් එතුමා. එක තැනකදි එතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා දැන් නිහාල් නෙල්සන් වගේ අය ගොඩක් ඉන්නවානේ කියලා. එතකොට එතුමා කියනවා වගේ වගේ අය බොහොම වැඩි වෙද්දි අගේ වැඩි වෙන්නේ මාගේ කියලා. එහෙම සුන්දරව හිතපු මනුස්සයෙක්. මොරටුව මහා නගර සභාවේ අපි එතුමා වෙනුවෙන් පද්ම ශ්‍රී සම්මානය ලබා දුන්නා. මොරටු මහා විද්‍යාලය එතුමාගේ ගී ප්‍රසංගයක් කරනකොට ඒ වෙනුවෙන් ප්‍රවීණ නිවේදන ශිල්පින් රැසක් ගෙන්නන්න හදනකොට එතුමා කිව්වා නෑ ප්‍රදීප් මෙය කරන්න කියලා. එහෙම අපිට අවස්ථාව දීලා අපිව යම් තැනකට ගෙන්න උත්සහ කළා. එයටත් අපි ගෞරවය පුදකරනවා මේ අවස්ථාවේ. බොහෝ කලා කරුවන් සම්මානයට පාත්‍ර වෙන්නේ මියදුනාට පස්සේ නමුත් මොරටුව මහා නගර සභාව නිහාල් නෙල්සන් මහතාව, පණ්ඩිත් අමරදේව ශුරීන්ව ජීවතුන් අතර සිටිද්දි පරණ ගාලු පාරට එතුමාගේ නම නම් කරලා අගය කළා වගේ නිහාල් නෙල්සන් මහතා ජීවත් වුන පාර නිහාල් නෙල්සන් මාවත නමින් නම් කරන්න විශේෂයෙන් ඒ ප්‍රදේශය නියෝජනය කරන කේසර රවීන්ද්‍ර මන්ත්‍රීතුමත්, නගරාධිපතිතුමත් සියළු දෙනාත් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සම්මත කරලා එතුමාට ගෞරව දැක්වුවා. එතුමා අපි අතර, නැති වුනත් සදා කාලිකව එතුමාගේ ගීත අපි අතර පවතිවි. එතුමාට උතුම් වූ නිවන් සුව ලැබේවා යැයි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, නිහාල් නෙල්සන් කියන අග්‍රගන්‍ය කලා කරුවා වෙනුවෙන් ශෝක ජනක යෝජනාවක් ඉදිරිපත් කරන මේ අවස්ථාවේදි එ සඳහා සහයෝගය ලබා දීම යුතුකමක්. දීර්ඝ කාලයක් මොරටුවේ අපිත් සමඟ ජීවත් වෙලා රාවතාවත්ත ග්‍රාමය නිජබිම කරගත් නිහාල් නෙල්සන් කලා කරුවා අපිට ඉතිරි වෙලා හිටිය මොහිදීන් බෙග් ගෙන් එහාට හිටිය ගායකයන්ගෙන් මිල්ටන් පෙරේරා, මිල්ටන් මල්ලවආරච්චි, ජෝතිපාල හා සමකාලීනව සිටිය ගායකයෙත් විදිහටත් ඒ වගේම සිනමාව තුළ ප්‍රවීන නළුනිළියන් හා අතීතයේ ජීවත්වුන කලා කරුවෙක් හැබැයි, වර්තමානයටත් ඔබින විදිහට කලාව හැඩගස්වාගෙන ආවා. අපි ඉපදෙන්න කලින් ගීත ලොවට අවතීර්ණ වුන නිහාල් නෙල්සන් මොරටු මහා විද්‍යාලයේ දීප්තිමත් ශිෂ්‍යයෙක් විදිහට අකුරු කරලා ඔහුගේ ගායන දිවිය පාසලෙන්ම අරඹහ කලා කියලා තමයි අපිට දැන ගන්න ලැබෙන්නේ. එදා මෙදා තුර එතුමා සතු වාර්තාව කඩලා නැහැ වැඩිම ගීත පට නිර්මාණය කරලා. එ වගේම පළමුවන ගීත පටය එළිදක්වපු ගායකයා විදිහට ඉතිහාසයට එක් වෙනවා. එතුමාගේ සුවිශේෂි ලක්ෂණයක් අපි දැක්කා වේදිකාවකට නැගලා ගීතයක් ගායනා කරනවනම් මොරටුවේ නෙවෙන්න පුළුවන් අපි ගිහිල්ලා හිටියම අපිව දැක්ක තැන සේනක මල්ලිත් අවිත් ඉන්නවා කියලා වේදිකාවේ ඉදලම කියනවා. නගරාධිපතිතුමා ගැනත් මෙතන ඉන්න සමහර මන්ත්‍රීවරු ගැනත් කියනවා. ඒ අපේ තිබ්බ ලෙංගතුකමට. ඒ වගේම එතුමා එතුමාගේ මුහුණු පොත නිවැරදි අන්දමින් පාවිච්චි කරනවා. පහුගිය කාලය පුරාවටම අනෙකුත් කලා කරුවන්ට තමන්ගේ හිතවතුන්ට සුභාෂිංසන යම් පණිවිඩයන් නිකුත් කරන්න හරියාකාරවම හසුරවපු කලාකරුවෙක් විදිහට මෙතුමාව දැක්කා. අමරදේව ශුරීන් මොරටුවට ගෙනාව අභිමානය හා සමානම අභිමානයක් නිහාල් නෙල්සන් මහතාත් අපිට එක්කලා. බයිලා කලාව තුළ ස්ව තන්ත්‍ර නිර්මාණය කර ගනිමින් නිහාල් නෙල්සන් මහතා රට වටේ ගියා. අදටත් එතුමා මිය ගියත් එතුමා භාරගත්ත ප්‍රසංග තවත් තියෙනවා. තමන්ගේ පළවෙනි සිංදුවේ සිටම මියෙදෙන මොහොත දක්වාම එක සේ තමන්ගේ ජනප්‍රියත්වය රැක ගත්තා එතුමා. අපිට ආඩම්බරයක් ගෙනත් දුන්න කලා කරුවෙක් මොරටුවට ආඩම්බරයක් ගෙනත් දුන්න කලා කරුවෙක්. පොළවේ පය ගහලා හිටපු කලා කරුවෙක්. එතුමා ගවමස් කෑමේ විපාකය සම්බන්ධයෙන් ගායනා කරපු ගීතය නිසාවෙන් ගව මස් නොකා අතහැරපු මිනිස්සු හිටියා කියලා අපි අහලා තියෙනවා. එතුමා පද රචනය කළ ගීතයක් වුනත් ඉතා හරවත් විදිහට එතුමා කළා. මේ මැතිවරණය කරන අවස්ථාවේදි මම සිංදුවක් හදා ගන්න එතුමාගේ නිවසට ගියා. එදා එතන හිටියා හේමසිරි හල්පිට කියන ගීත රචකයාත් හිටියා මම හිතුවා ටික දවසක් යයි කියලා ගීතය නිර්මාණය කරන්න කියලා. එත් එවෙලෙම හේමසිරි හල්පිට මහත්තයට කියලා මට ගීතය හදලා දුන්නා. ඒ නිසා අපිට මෙතනට එන්න යම්කිසි දායකත්වයක් දක්වපු

පුද්ගලයෙක් යැයි කියමින් එතුමා රැස්කළ සියළු කුසල් බලයෙන් එතුමාගේ පරලොව ජීවිතය සාක්ශාත් කර ගන්න, සැපවත් කරගන්න ලැබේවා යැයි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඉතාමත් කාලෝචිත ලෙස මොරටුව අපේ පුරවරය තුළින් මුළු රටක් බබළවපු නිහාල් නෙල්සන් ආදරණීය කලා කරුවාගේ ඒ අභාවය සම්බන්ධයෙන් කරන ශෝක යෝජනාවේදී මමත් අදහස් කිහිපයක් පල කරන්න කැමති. ගරු නගරාධිපතිතුමනි, නිහාල් නෙල්සන් කලා කරුවා මා හඳුනා ගන්නේ මා කුඩා කාලයේ ඉඳලා. විශේෂයෙන් අපේ මාමාගේ මවුන් වයිම්ස් සංගීත කණ්ඩායමත් එක්ක එතුමට විශේෂ සම්බන්ධයක් තිබුණා. අපේ මාමාගේ නිවසට නිතරම එතුමා පැමිණෙද්දි අපිව හුරතල් කරපු කලා කරුවෙක්. ජනසෙත කලාකෙත ඉදිකිරීමට පෙර එම ස්ථානයේ තමයි සංගීත ප්‍රසංග පැවැත්තුවේ. ඒ අවස්ථාවන් වලදී මා හට ගීත ගායනා කරන්න ලැබීමත් නිසා මට එතුමාව කුඩා කල සිටම වේදිකාවේදී ඇසුරු කරන්න ලැබුණා. කලා කරුවන් කියන්නේ ඉතාමත් සුන්දර හදවතක් තියෙන මිනිස්සු ඒ සුන්දර හදවත හොඳින් පිළිබිඹු වෙච්ච චරිතයක් තමයි එතුමා. ඔහු 70, 80 දශක වල ජනප්‍රියත්වයේ ඉහළම හිටපු කලා කරුවෙක්. නිහාල් අයියා ඔහුව එතනට ගෙනාපු ජනතාවව කවදාවත් අමතක කලේ නැහැ. සමහර ගායකයෝ සිංදු දෙකක් කියපු ගමන් වේදිකාවට නගින්න ඉල්ලන්නේ 80000යි 100000යි. හැබැයි නිහාල් නෙල්සන් කලා කරුවා ඒ මුදල පසුපස හඹාගෙන ගිය කලා කරුවෙක් නෙවෙයි ගරු නගරාධිපතිතුමනි, එතුමා වේදිකාවේදි ප්‍රේක්ෂකයෝ සිංදු ඉල්ලන පාරට සිංදු 10ක් උනත් කියන කලා කරුවෙක්. ඒ තරම් මිනිස්සු එක්ක බැදිච්ච කලා කරුවෙක්. මෙවන් කලා කරුවෝ හරි දුබලයි නගරාධිපතිතුමනි, මොරටුවේ විවිධත්වය, විචිත්‍රත්වය තමයි මේ.මම දන්න විදිහට එතුමාගෙ පළවෙනි ගීතය ලස්සනට පිපුණ වන මල් ගීතය ඒ ගීතය අපි පාසල් යන කාලේ ඉඳලා අදටත් උත්සව වල ප්‍රසංග වල ගායනා කරනවා. අපි තරුණ කාලේ දේශපාලන සාකච්ඡා වල කලාව කොටස් 2 ට වෙන් කරගෙන තිබුණා එකක් පීචන් කලාව එකක් ප්‍රබුද්ධ කලාව කියලා. ජෝතිපාලව නිහාල් නෙල්සන්ව දලා තිබුනේ වෙනම කොටසකට. අමරදේව, නන්දා මාලනීලාව දාලා තිබුනේ වෙන කොටසකට නමුත් පසුකාලීනව අපි තේරුම් ගත්තා අර වෙන්කිරීමම කොච්චර පීචන්ද කියලා. අවසානයේ මේ කලා කරුවා අතින් ඉතා සරල උනත් ආදර්ශාත්මක ගීත රැසක් නිර්මාණය වෙලා තිබුණා. අපේ ජීවිතයේ ගැඹුර ගැන කොච්චර එතුමා උකහාගෙන තිබුනද කියලා මම එතුමාගේ එක ගී පද වැලකින් කියමින් එතුමාට නිවන්සුව ප්‍රාර්ථනා කරමින් මා මේ පද වැලින් මගේ ගුණකථනය නිමා කරනවා.

"පත්තරවල විස්තරගොඩ ඇස් ඇරගෙන තප්පරයට අපි කියවනවා
පිත්තලමොල රත්කරගෙන දුක්කරදර පැක්කරගෙන දවස ගෙවනවා"

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ. පී. එම්. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, සභාවක් විදිහට අපගේ ශෝක යෝජනාව එතුමාගේ පුතණුවන්ට ලබා දෙන මේ වෙලාවේ. අපිට තිබෙන්නේ ඔහු පිළිබඳ ගැඹුරු ආදරයක්, ඒ ආදරය අපේ ගැඹුරුම තැනක තැන්පත් කරලා යන්න ඔහු නික්ම ගියා. මොරටුවට ආදරය කළ මොරටුවේ නම ජාත්‍යන්තරයට රැගෙන ගිය විවිධ ක්ෂේත්‍ර නියෝජනය කළ විදවතුන්, උගතුන්, බුද්ධිමතුන් කලා කරුවන් අතර අපිට වෙනසක් නැහැ නිහාල් නෙල්සන් කලා කරුවා සම්බන්ධව ඔහුද ඔහුට ලැබිච්ච ජීවිතය ඇතුලේ දීර්ඝකාලයක් මේ සොබා සෞන්දර්ය මිනිස් ජීවිත තුළ ඉතා හොඳින් ප්‍රතිනිර්මාණය කර ඔහු පෙන්නන ලද අති දක්ෂ ඒ හැකියාවට අපි ආදරය කළා විවධ තල වල මිනිසුන්ට ඔහු පණිවිඩයක් දුන්නා. මම පුද්ගලයෙක් විදිහටත් එතුමාගේ අවසන් කටයුතු
සිදුවෙන වෙලාවේ ඒගිනි දැල්වෙනවිතකය දිහා බලා හිටියේ ලොකු වේදනාවකින්. ඒ මම මේ මොරටුවට වටිනාකම් ගෙන මිනිසුන්ට ආදරය කරන මිනිසෙක් නිසා. ඒ ආදර කරන මිනිසුන් අල්පය අතර නිහාල් නෙල්සන් කලා කරුවා ඉහළම හිටපු කෙනෙක් නිසා. මම ගීත ගායනා කරන්න දන්න කෙනෙක් නෙවෙයි හැබැයි මම පාසල් කාලේ සිටම නිහාල් නෙල්සන් මහතාගේ ගීත වල කොටස් දන්නවා. ඒ දන්න කොටස් නිතරම කටේත් තියෙනවා. එක තමයි බැදීම. ඔහු මිනිසා පිළිබඳ මොන තරම් උකහාගෙන හිටියද කියලා අපි දැන ගත්තා එතුමා ගැන කල කතා වලින්. එක් අයෙකුගෙන් මයික් එක ගන්නවත් උනේ නැහැ එතුමා ගැන කතා කරද්දි. ඒ තරම්

මිනිස්සුන්ට සමීප වෙච්ච කෙනෙක්. මිනිස්සුන්ට හදවතට කිඳා බැහැපු දක්ෂයෙක්. එම නිසා අපි අපේ ගෞරවය පුද කරන ගමන්ම අපේ හෙන්රිඅයියා ඇවිත් කිවුවා. නිහාල් නෙල්සන් මහතාගේ පලවෙනි ගීත පටය එළිදක්වන වේලාවේ විචිත්‍ර චිත්‍ර සඟරාවේ ලිපිය ලියන්නේ හෙන්රි අයියා ඒ 1961 එතන ඉඳලා නොමැකෙන නමක් තියලා, තමන්ගේ යුතුකම ඉටුකරලා ගිය ශ්‍රේෂ්ඨයෙක් හැටියට එතුමන්ට ජනතා විමුක්ති පෙරමුණේ ගෞරවය පල කර සිටිනවා.නිහාල් නෙල්සන් කලා කරුවනි ඔබට නිවන්සුව ලැබේවා යැයි අපි ප්‍රාර්ථනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, නිහාල් නෙල්සන් මැතිතුමා සම්බන්ධව ශෝක ප්‍රකාශය කරන මේ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂය වෙනුවෙනුත් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන සියළුම මන්ත්‍රීවරුන්ගෙත් ශෝකය එතුමන්ගේ පවුලේ සියළු දෙනාට අපි පුදකරනවා. නිහාල් නෙල්සන් මහතා ගැන මට පෙර කතා කරපු සියළු මන්ත්‍රීවරු කියපු ඒ කාරණා සියල්ලකටම මා එකඟ වෙන අතර ගරු නගරාධිපතිතුමාගේ ඉල්ලීම මත මගේ කතාව කෙටි කරන්න බලාපොරොත්තු වෙනවා. නිහාල් නෙල්සන් කලා කරුවා මම හඳුනා ගන්නේ 1988 වර්ෂයේ පමණ මම පළාත් සභාවට තරඟ කරන අවස්ථාවේදී ඒ වේදිකාවේ එතුමා ගායනා කරන්න ආවා. එතුමා එදා ගීතයක් ගායනා කරලා මා ගාවට ඇවිත් කිවුවා මම ප්‍රාර්ථනා කරනවා ඔබතුමා ටිරෝන් ප්‍රනාන්දු ඇමතිතුමාගේ බෑණා ඔබතුමා ඉස්සරහට එන්න ඕන කියලා. ටිරෝන් ප්‍රනාන්දු ඇමතිතුමාගේ හොඳ හිතවතෙක් එතුමා. මේ රටේ වාර්තා රැසක් තබපු ගායකයෙක් ඔහු. ඒ වගේම එතුමා ගවයන් ගැන කියපු ගීතය නිසා ගව මස් කෑමෙන් විශාල ප්‍රමාණයක් ඉවත් වුණා කියලා මම අවුරුදු ගණනකට කලින් පුවත් පතකත් දැක්කා. අවසාන වශයෙන් ගරු නගරාධිපතිතුමනි, අපිට සතුටු විය හැකි කරුණක් තියෙනවා. එනම් මේ දක්ෂ සංගීතවේදීයා ජීවත් වෙලා ඉන්නකොට එතුමාගේ නමින් එතුමා ජීවත්වනු පාර නම් කරලා එතුමාට ලොකු ගෞරවයක් ලබා දීම ගැන. මේ වගේ කටයුතු අපි සමාන්‍යයෙන් කරන්නේ මියගියාට පස්සේ. නමුත් මේ ගරු සභාව ඔබතුමාගේ නායකත්වයෙන් එදා ඒ කටයුත්ත කිරීම ගැන මොරටුවේ මන්ත්‍රීවරු හැටියට අපිට ආඩම්බර විය හැකියි. අප අතරින් වෙන්වී ගිය කලා කරුවාට එතුමා අදහන ආගම අනුව ඒතුමාට නිවන් සුව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, කුක්කු කුක් කුක් කුකුළා හඬන වෙලාවට ලස්සනට පිපුණ වනමල් තිබෙන පාර දීගේ ගුණේ අයියාගේ බජව් දාන කාමරයට එන්න කියපු එතුමා සල්ලි මිටි ගණන් තිබ්බට කාවඩි නැටුවට කමක් නැහැ, කරුණා සුවඳ තවරලා එපා එපා මස් කන්නට කිරි අම්මාගේ කියන පණිවිඩය අපිට දුන්නා. ඒ නිසා විශේෂයෙන් මේ වැඩ සටහන ඇත්තටම එතුමාගේ මේ ගීතය අපේ හදවත් තුළ ගැඹුරටම ගිහිල්ලා එකමුතු වෙච්ච ගීතයක් හැටියට මේ එපා එපා මස් කන්නට කිරි අම්මාගේ කියන ගීතය අපිට හඳුන්වන්න පුළුවන් ඒ නිසා තමයි සභිකයෙක් විදිහට මොරටුව මහා නගර සභාවට ගෙනාපු පළවෙනි යෝජනාව විදිහට මොරටුව ගව ඝාතකාගාරය නවත්වන්න යෝජනාව ගෙනකොට ඒ ගීතය පසුබිමක් උනා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි ඔබතුමාලා වගේම එතුමා එක්ක අපේ හිතවත්කම කලාන්තරයක් තිබුනා. එතුමාගේ පුත්‍රරත්නයව අපි හොඳ මිතුරෙක් හැටියට අපි කාලයක් ආශ්‍රය කළා ඒ දරුවාගේ තිබුණ ගුණය යථාවාදී තාථා කාරී තාථාවාදී යථාකාරි කියන ගුණය ඒ විදිහටම තිබුණ එතුමාගේ ගීත වලින් අපි එතුමාගේ ඒ ගුණය දැක්කා ඒ නිසා විශේෂයෙන් එතුමා ලෝකයට නොකිවුවට මෙලොවට වගේම පරලොවටත් අවශ්‍ය පිං දහම් කළා එතුමා චෛත්‍ය රාජාණන් වහන්සේ නමක් සකස් කරලා සසුනට පූජා කළා ඒ වගේම මාලනී මහත්මිය දැවැද්දට ගෙනාව ඒ අල්මාරියත් විහාරස්ථානයට පූජා කළා. එතුමා එවැනි පිං දහම් කර ගත්තා. කැසට් 113ක් සකස් කරලා ගීත 4000කට අසාන්න ප්‍රමාණයක් කියපු ගීත ක්ෂේත්‍රයේ ජෝතිපාල මැතිතුමා වගේම නිහාල් නෙල්සන් කියන නම

තමයි කැසට් ලෝකයේ වැඩිපුරම කියවෙන්නේ. දවසක් මම විහිළුවට කිව්වා නිහාල් අයියේ දැන් නිහාල් අයියාගේ කැසට් ගහන රේකෝඩ් එක ඉවරයි කියලා, ඇයි මල්ලි මොකද කියලා ඇහුවම මම කිව්වා, දැන් 113 ක් කැසට් ගැහුවා දැන් ගෝඨාභය මහත්තයා 113ටත් එහාට ගිහින් ගැසට් ගහලා තියෙනවා කියලා විහිළු කළා එතුමා එක පිළිගත්තා. මට මතකයි මම කොරෝනා හැදිලා ඉද්දි ඒ අවස්ථාවක මට කතා කරලා මොනවද වෙන්න ඕන කියලා ඇහුවා. ධනපාල උඩවත්ත මහතා දවසක් සංගීතයකට යන්න එළියට බහිනකොට වතුර ගලලා යන්න බැහැ ඇහේ මඩ ඒ වෙලාවෙදි  නිහාල් නෙල්සන් මහතා එක්ක ඒක කියනකොට ධනපාල උඩවත්ත මහතා කිව්වා මම අවුරුදු  හතලිස් ගාණක් සිංදු කියලා මෙතනින් ගිහින් තියෙනවා නමුත් පාර හදාගන්න බැරි උනා කියලා  නිහාල් නෙල්සන් මහතා මට කිව්වා මෙතුමාගේ පාර පොඩ්ඩක් හදලා දෙන්න කියලා. අපිට පුළුවන් උනා ඒක කරලා දෙන්න. මේ වෙලාවෙදි ස්වර්ණමය යුගයක් අවසන් වුනේ. අවසාන වශයෙන් එතුමාට නිවන් සුව ලැබේවා යැයි ප්‍රාර්ථනා කරන අතර එතුමාගේ පුත්‍ර මාගේ කල්‍යාණ මිත්‍ර තරංග මහතාටත් පවුලේ සැමටත් ශෝකය ප්‍රකාශ කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී  - එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>

"සද්දේදාල ගොඩක් දෙනවා ඒ හින්දම කන්නෝ වැඩිලු
කාපු ගමන් බඩ පිරුණත් දිරව ගන්න ලේසිත් නෑලු
මල්ලි..... අනන් මනං දාල ගහන කොයි කාගෙත් තැටිවල යාලු
අද හඩ විතරයි හරයක් නෑ.... අනේ කොත්තු රොටිය වගේලු
ලට්ට පට්ට එකතු කරලා දවසේ ඉතුරු හරිය.....
සද්ද බද්ද දාල හැදුව මේක කොත්තු රොටිය.....//"

ගරු නගරාධිපතිතුමනි, රාවතාවත්ත ප්‍රදේශයේ කොට්ඨාශ මන්ත්‍රීවරයා විදිහට පසුගිය දෙසැම්බර් 13වන දා අපේ ප්‍රදේශයට බොහොම ශෝක ජනක දිනයක් වුනා මොකද මොරටුවටම තිබූ ප්‍රදීපාගාරයක් එදා අලෝකය නැතිවී ගියා. හැබැයි මට විශ්වාසයි නගරාධිපතිතුමනි වෙනත් ගායකයන්ගේ වගේ නොවෙයි නිහාල් නෙල්සන් කියන ගායකයාගේ හඩ කතරගම දේවාලේ තියෙන තාක්කල් නොමැරී තියෙවී. මේ රටේ ගවමස් කන නොකන මිනිස්සු ඉන්නකන් එතුමාගේ හඩ පවතීවි. මව් සුවඳ දන්න මිනිස්සු ඉන්නකන් එතුමාගේ හඩ පවතීවි. එතුමා සමාජයේ සිදු වන සිදුවීම් ලස්සනට ගී වලින් සමාජ ගත කළා. අපි එතුමාගේ මරණය සිදුවුන මොහොතේ සිටම අවශ්‍ය සියළු දේ ගිහින් කලා.එතුමාගේ මරණ සහතිකය පවා හදාගෙන ආවේ මම නගරාධිපතිතුමනි එතුමාගේ පුතා සමඟ ගිහිල්ලා. එතුමාගේ පුතා මරණ සහතිකේට ලිව්වේ ඒ වෙලාවේ රාවතාවත්ත සුසාන භූමියේ අවසන් කටයුතු කරනවා කියලා. පසුව කට්ටිය සාකච්ඡා කරද්දි මෙය බොරුල්ලේ කනත්තට ගෙනියන්න හදද්දි එතුමන්ගේ පුතා කිව්වා නැහැ මෙය කරන්නනේ මොරටුවේ ආදාහනාගාරයේ මොකද මොරටුවේ මිනිස්සු තරම් තාත්තාට කවුරුත් ආදරය නැහැ කියලා. මම ඒ අවස්ථාවේදී කිව්වා ආදාහනාගාරයේ නැතුව අපි නගරාධිපතිතුමාගෙන් හොඳ තැනක් ඉල්ලගෙන වෙන තැනක කරමු කියලා. මම කියන්නේ මොරටුවේ ජීවත්වුණ කීර්තිමත් ගායකයා වෙනුවෙන් සභාවක් විදිහට කරන්න පුළුවන් සැම දෙයක්ම කලා. ඒ සම්බන්ධයෙන් කොට්ඨාශේ මන්ත්‍රීවරයා විදිහට ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි ජීවත්වුණ කර්කෂ සමාජයට වෛද්‍යවරයෙක් වුනේ නිහාල් නෙල්සන් මහතා. එතුමා වේදිකාවක සිංදු කියනවනම් මිනිස්සු ප්‍රශ්න අමතක කරලා මානසික සුවයක් ලබනවා. ඒ මානසික සුවය කොච්චරක්ද කියනවනම් එතුමාගේ අවමංගල්‍ය වෙලාවේදි එතුමාගේ සිංදු දැම්මම අපිට එක අවමංගල්‍යක් කියලා අමතක වෙලා නැටුනා. මරණය අපි සැම දෙනාටම පොදුයි. මේ අවස්ථාවේදී එතුමාගේ පවුලේ සියළුදෙනාට ශෝකය ප්‍රකාශ කරමින් මා නිහඩ වෙනවා.

<u>ගරු නගරාධිපති  -  ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, විශේෂයෙන්ම නිහාල් නෙල්සන් ගරු කලා කරුවා වෙනුවෙන් එතුමාගේ ජීවිතය ගොඩනඟනකොට එතුමා කොටකලිසමක් ඇඳගෙන ලස්සනට පිපුණ වනමල් ගීතය කියලා ඊට පස්සේ එතුමා

"ඔරු පදින්න පහළ ගඟට එන්න යන්න මාලි
මං බොරු කරන්නේ නැනේ ඔබට ඇත්තයි මගේ මාලි
සරු දිවියක රස බලන්න කාලේ ළඟයි මාලි
පේරු රත්තරන් වාගේ මගේ ආදර මාලි..///
මගේම මාලි"

කියලා මාලිව විවහා කර ගත්තා ඒ විවාහය බොහොම සාර්ථක විවාහයක් කරගෙන ආදරණීය පුතෙකු බිහිකරලා ඊට පස්සේ

"කිරි දුන්නේ දරුවන්ටයි සිරුරෙන් ඇගේ
පිරිපුන් මිනිසුන් වැඩුනේ බලයෙනි ඇගේ
ඒ කළ ගුණ නොදන්න හිස් මිනිසුන් වගේ"
එපා එපා මස් කන්නට කිරි අම්මාගේ"

සිංදුව අහලා පිං කර ගත්ත මිනිස්සු ගොඩක් ඉන්නකොට මේ සිංදුව ලියපු කෙනා එදා නමින් වීරසේකර හමුදාවක හෝ සිවිල් ආරක්ෂක බලකායක සිටි ඔහු අවසානයේ මියැදෙනවා මහා සඟරුවනක් ලෙස. මම හිතන්නේ එහෙම තමයි ඒක උනේ ඊට පසුව"කරුණා සුවඳ තවරාලා"ගීතය ගායනා කරලා අනෙක් පැත්තෙන් "මේක ගුණේ අයියාගේ බජව් දාන කාමරේ" ගීතය කියලා ඔහු මෙහෙමත් කියනවා ගීතයක්.

"මා මළ දා සොහොන් කොතේ ගී ලියන්න එපා
නන්නාදුනනා හඬකින් ගී ගයන්න එපා
කුරුල්ලනේ රැහියියනේ තනී රකින්න එපා
මගේ ලොවට එළිය දෙන්න ඉටිපන්දම් එපා
බියර් විස්කි බීලා වරෙන්
කුකුල් කකුල් කාලා වරෙන්
මගේ සිංදු ඇතිවෙනකම් දාගෙන නටපන්"

කියලා එතුමා කියනවා. ඒ නිසා මම කියනවා නිහාල් නෙල්සන් මහතා අඩු වැඩියෙන් කියපු කතා ඔක්කොම එතුමාට උපහාරයක් වේවා. නිහාල් නෙල්සන් කලාකරුවාණන් වෙනුවෙන් මම හිතනවා ඊළඟ පළවෙනි කර්මාන්ත කමිටුවේ යෝජනාවක් සම්මත කරලා ස්මාරකයක් හදන්නට අපි සියළු දෙනාගේ එකඟතාවය ලැබෙනවා කියන පණිවිඩය අපි එතුමාගේ පුතුණුවන්ට ලබා දුන්නා. එයට හේතුව ඒ කලාකරුවා වෙනුවෙන් අපිට කරන්න තියෙන්නේ ලොකුම දේ එයයි කියලා අපි හිතුවේ ඔහු මියගියාට පස්සේ ලොකු ග්‍රවුන්ඩ් එකක් හොයාගෙන ලොකු සැයක් ගහලා, ලොකුවට සරසලා, ලොකුවට ගුණකථන කරලා උපහාර කරන්නට අපි සැළසුම් කලේ නැහැ. අපි ඉද්දි පද්ම ශ්‍රී ගෞරව නාමය පුදකලා. ඒ අතර ජීවතුන් අතර ඉන්නවා දෙන්නෙක් තුන්දෙනෙක් මියගිහිල්ලා ඒ තමයි පණ්ඩිත් අමරදේව ශූරීන්, තිස්ස ගුණවර්ධනයන්, අනෙත් කෙනා නිහාල් නෙල්සන් මහතා. තුන්දෙනෙක් මිය ගිහිල්ලා දෙන්නෙක් ජීවතුන් අතර ඉන්නවා .ඒ තමයි ජගත් චමිල, ඒ.ටි.ආරියරත්න ඒ සමුහයේදි මම හිතන්නේ මේ නම ලබා දුන්නේ ප්‍රදිප් ශියන්ත මන්ත්‍රිතුමා.පද්ම ශ්‍රී මොරටු පුත්‍ර කියලා නිහාල් අයියා මෙහෙම කිව්වා වේදිකාවට ගොඩවෙලා මැරුණට පස්සේ කරන උපහාරයන් වලට වඩා ජීවතුන් අතර ඉන්දෙද්දි කලාකරුවන්ව අගය කරන්නට පුලුවන් මිනිසුන් මොරටු මහා නගර සභාවේ පත්වෙලා ඉන්න එක අපි බොහෝ සේ සතුටට පත්වෙනවා කියලා නිහාල් අයියා කිව්වා.ඒනිසා ජීවතුන් අතර සිටිය නිහාල් අයියා මොන වේලාවකවත් අසතුටෙන්, අසමගියෙන්,අසන්තෝශයෙන් ජීවත්වෙච්ච කෙනෙක් නෙමෙයි. සමගියෙන්,සතුටෙන්,විවෘතව ජීවත්වෙච්ච කෙනෙක් විදියට එතුමා එතුමාගේ උපහාරය ලබන එක මොනතරම්ද කියන එක පැහැදිලිවෙනවා. එතුමාගේ මාර්ගයේ එතුමාගේ දේහය ගෙනියන්න පුලුවන් වෙනකොට ඒ මාර්ගය නිහාල් නෙල්සන් කියන නමින්

නම් වෙද්දි මම හිතනවා අදට මගේ ජීවිතයේදි මා මුහුණු දුන්නු අවස්ථාවන් වලදි ප්‍රදිප් ශ්‍රියන්ත ගරු මන්ත්‍රිතුමා නම් කලා පණ්ඩිත් අමරදෙවයන් කියන නාමය පරණ ගාලු පාරට කුරුස හන්දියේ ඉදලා .එක විරෝධයක්වත් තිබුනේ නැත.ඉන්පසු පාරවල් වලට නම් කිරිමේදි විරෝධතා කොතෙක් ආවත් නිහාල් නෙල්සන් මහත්මාගේ ඒ නමටද විරෝධතාවයන් ආවේ නැත.එන්නට අවශ්‍ය නොවන පරිදි මගේ ගරු මන්ත්‍රිතුමා නිහාල් අයියා ජිවතුන් අතර ඉන්දෙද්දි කේසර රවින්ද්‍ර මන්ත්‍රිතුමා ගෙයින් ගෙට ගිහිල්ලා ඒ කාර්යභාරය කලා. මම හිතන්නෙ ඒ උපහාරයන් අපි ජිවත්ව සිටියදි කලා.

අංක 05(01) දරණ යොජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු නගරාධිපති - ඩබ්ලිව්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු කොමසාරිස්තුමනි, ගරු ලේකම්තුමනි, තරංග පුතාට, ලේලියට,සිගිති මිනිබිරියට අපේ මොරටුව මහා නගර සභාවේ ශෝකයත් එතුමාට උපහාරයක්ම පිණිස මෙම ශෝක යෝජනාව සන්පිණ්ඩනයක් ලෙස, සන්දේශයක් ලෙස ඔවුන්ට ලබා දෙන්න කියන ඉල්ලිම කරනවා.මෙය ඉක්මණින්ම කරන්න කාලය අපිට හරස්වෙන්නට පෙර මෙය ඔවුන් අතට ලබා දෙන්න කියන කාරුණික ඉල්ලිම කරනවා.

## 06 <u>2022 දෙසැම්බර් මස ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.</u>

**06(01) 2022.12.05 දින පැවති ආයතන හා නිතිය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.**

**2022.12.05 දින පැවති ආයතන හා නිතිය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | ඩබ්ලිව්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අතුර ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඛේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී. සුසන්ත පෙරේරා මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් පැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |

| | | | |
|---|---|---|---|
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දිපා චාන්දනි ආරියවංශ මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්. ඒ. දෝන දිලාශිනි මහත්මිය |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |

**2022.12.05 දින පැවති ආයතන හා නිතිය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තිරණයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

**2022.12.05 දින පැවති ආයතන හා නිතිය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් වැඩි ඡන්දෙන් සභා සම්මත විය.**

(මෙම අවස්ථාවේ පහත නම් සදහන් මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජෙරාඩ් ප්‍රනාන්දු මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී. ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය) |

**06(2) 2022.12.06 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.**

**2022.12.06 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | ඩබ්ලිව්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |

3. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - යූ.ලලිත් ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - එෆ්.බී.නිලංක සිල්වා මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එම්.කේ.පී. සුසන්ත පෙරේරා මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එම්.කුමාර රාජරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - එම්.පිලිප් පැන්සිස් ප්‍රනාන්දු මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය
22. මහා නගර සභා මන්ත්‍රී - එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - ඒ.දිපා චාන්දනි ආරියවංශ මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාළ මහතා
27. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
28. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා
29. මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්. ඒ. දෝන දිලාශිනි මහත්මිය
30. මහා නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා
31. මහා නගර සභා මන්ත්‍රී - එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය
32. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය

**2022.12.06 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තිරණයන්ට විරුද්ධව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
4. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය
6. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

**2022.12.06 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් වැඩි ඡන්දෙන් සභා සම්මත විය.**

(මෙම අවස්ථාවේ පහත නම් සඳහන් මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ.

| | | | |
|---|---|---|---|
| 01 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා |
| 02 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජෙරාඩ් ප්‍රනාන්දු මහතා |
| 03 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 04 | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා |
| 05 | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 06 | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී. ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය) |

**06(3) 2022.12.06 දින පැවති මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.**

**2022.12.06 දින පැවති මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | ඩබ්ලිව්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී. සුසන්ත පෙරේරා මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
